# II-1961 ආර්ථික හා මූල්‍ය හැඩගැස්ම

## (අ) ජාතික නිෂ්පාදිතය සහ වියදම

### හැඳින්වීම

1961 දළ ජාතික නිෂ්පාදිතය පවත්නා සාධක මිල අනුව, රුපියල් කෝටි 627·4 කට තාවකාලිකව ඇස්තමේන්තු කොට ඇත. සංශෝධිත[1] ඇස්තමේන්තු අනුව 1959 දී මෙය රුපියල් කෝටි 584·4 කට සහ 1960 දී රුපියල් කෝටි 612·7 කට ගණන් බලා තිබේ. මේ අනුව 1961 දී දළ ජාතික නිෂ්පාදිතය 1960 ට වඩා සියයට 2·4 කින් වැඩි වී ඇති අතර 1960 වාර්ෂික වැඩිවීම සියයට 4·8 ක්ව ඇත.

සංසන්දනාත්මකව බලනවිට 1961 දී දළ ජාතික නිෂ්පාදිතයේ වර්ධනය අඩුවීමට බොහෝ දුරට හේතු වී ඇත්තේ පිටරට පටවන භාණ්ඩවල මිල පහළ වැටීම යැයි කිව හැකිය. පිටරට පැටවූ මූළ භාණ්ඩ ප්‍රමාණය වැඩි වුව ද, තේ පරිමාව මධ්‍යස්ථ වශයෙන් ද, පොල් නිෂ්පාදිත සැලකිය යුතු ප්‍රමාණයකින් ද වැඩි විය. අපනයන මිල අඩුවීම නිසා පවත්නා මිල අනුව එහි වටිනාකම අඩු විය. එහෙත් ස්ථාවර මිල අනුව ගණන් බලා මිල වෙනස් වීමෙන් ඇතිවන බලපෑම අස් කළ විට 1961 දළ ජාතික නිෂ්පාදිතයේ නිරපෙක්ෂිත වර්ධනය 1960 ට වඩා සැලකිය යුතු ප්‍රමාණයකින් වැඩි බව හෙළි වේ. මෙය 11–1 වැනි සංඛ්‍යා සටහනෙහි දැක්වේ. මෙහි නිෂ්පාදනය සහ වියදම දක්වන දර්ශක සාරාංශයද දක්වා ඇත. දළ ජාතික නිෂ්පාදිතය සාධක මිල අනුවද, 1956 ස්ථාවර මිල සහ 1959 ස්ථාවර මිල(2) අනුව ද එහි දක්වා ඇත.

1956 ස්ථාවර මිල අනුව, 1960 දළ ජාතික නිෂ්පාදිතයේ වාර්ෂික වැඩිවීම සියයට 5·3 ක් වන අතර, 1961 වැඩිවීම සියයට 3·6 ක් වෙයි. 1959 ස්ථාවර මිල අනුව මේ වැඩි වීම පිළිවෙළින් සියයට 5·1 ක් සහ සියයට 4·2 (3) ක් වෙයි. ජනගහනය වැඩිවීමේ වේගය ද සැලකිල්ලට ගෙන බලන කල (1959 මැද සිට 1960 මැද වන විට, ජනගහනය සියයට 2·8 කින් සහ 1960–61 මැද අවුරුද්දේ ජනගහනය සියයට 2·7 කින් වැඩි වී ඇත. 1960 ප්‍රතිශීර්ෂයකට වැටෙන දළ ජාතික නිෂ්පාදිතය සියයට 2.0 කින් මුදල් වශයෙන් වැඩි වී ඇති අතර, 1961 දී එය සියයට 0·4 කින් පහළ වැටී ඇත. එහෙත් 1956 දී ස්ථාවර මිල අනුව ප්‍රතිශීර්ෂයකට වැටෙන මූර්ත ආදායම 1960 දී සියයට 2·4 කින් හා 1961 දී සියයට 0·9 කින් වැඩි වී ඇත. 1959 ස්ථාවර මිල අනුව ප්‍රතිශීර්ෂයකට වැටෙන මූර්ත ආදායමේ වැඩිවීම මේ දෙවර්ෂයට පිළිවෙළින් සියයට 2·3 ක් සහ සියයට 1·3 ක් වෙයි.

---

1. 1959 හා 1960 සඳහා මෙහි දැක්වෙන ඇස්තමේන්තු සංඛ්‍යා හා ජනලේඛන දෙපාර්තමේන්තුවෙන් සහ මහ බැංකුවෙන් මුලින් පළ කළ සංඛ්‍යා වලට වඩා කරුණු ගණනෙක් නිසා වෙනස් වෙයි. ඉන් ඉතා වැදගත් කරුණු ජාතික නිෂ්පාදිතය හා වියදම පිළිබඳ ක්‍රම දක්වන සටහනේ දැක්වේ.

2. වෙනත් පාද වර්ෂයන් අනුව, ස්ථාවර මිල තක්සේරු කරන විට එක හා සමාන මිලක් ලැබෙන්නේ නොවේ. මෙසේ වන්නේ ඒ ඒ පාද වර්ෂය අතර මිල ක්‍රමයෙහි ඇතිවන වෙනස් වීම් අනුව ස්ථාවර මිල තක්සේරුවට ගනු ලබන ශීර්ෂ වල බර තැබීම් වෙනස් වන නිසාය. 1959 ස්ථාවර මිල 1956 ස්ථාවර මිලට වඩා පිළිගත හැකිය මෙයට හේතුව 1959 දී 1956 ට වඩා මිල ගණන් පිළිබඳ සංඛ්‍යා තොරතුරු ලබාගැනීමට හැකි වීමයි. කෙසේ වුව ද මේ වාර්තාවෙන් 1956 ස්ථාවර මිල අනුව කැරුණු තක්සේරු සමගම 1959 ස්ථාවර මිල අනුව කරන තක්සේරු ද, දී ඇත. මෙයට පෙර වාර්ෂික වාර්තාවල දී තිබුණු ස්ථාවර මිල තක්සේරු 1956 ස්ථාවර මිල අනුව සකසා තිබිණ.

3. මෙයට ඉහත අඩෝ ලිපියෙහි සඳහන් පරිදි 1959 ස්ථාවර මිල අනුව හා 1956 ස්ථාවර මිල අනුව තක්සේරුවේදී ඇතිවන වෙනසට හේතු වී ඇත්තේ ඒ ඒ පාද වර්ෂ මිල ගණන් වලට බර තැබීම් වෙනස්වීමය

## සංඛ්‍යාසටහන II—1

## නිෂ්පාදිතය හා වියදම දර්ශක සාරාංශ

| | පවත්නා මිල ගණන් අනුව | | | 1956 ස්ථාවර මිල අනුව | | | 1959 ස්ථාවර මිල අනුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 1959 | 1960 | 1961 | 1959 | 1960 | 1961 | 1959 | 1960 | 1961 |
| **(අ) වටිනාකම්** | | | | | | | | | |
| 1 සාධක මිල අනුව දළ ජාතික නිෂ්පාදිතය (රුපි: දශලක්ෂ) .. | 5844 | 6127 | 6274 | 5557 | 5850 | 6060 | 5844 | 6141 | 6396 |
| 2 වෙළෙඳ මිල අනුව පෞද්ගලික පාරිභෝජන වියදම හා දේශීය ප්‍රාග්ධන සම්පාදනය (දළ) (රුපි: දශලක්ෂ) | 6549 | 6782 | 6735 | 6389 | 6625 | 6609 | 6549 | 6769 | 6776 |
| 3 වෙළෙඳ මිල අනුව පෞද්ගලික පාරිභෝජනය (රුපි: දශලක්ෂ) .. | 4448 | 4709 | 4625 | 4451 | 4710 | 4668 | 4448 | 4699 | 4666 |
| 4 වෙළෙඳ මිල අනුව රජයේ පාරිභෝජනය (රුපි: දශලක්ෂ) .. | 1050 | 1076 | 1067 | 1036 | 1063 | 1053 | 1050 | 1075 | 1063 |
| 5 වෙළෙඳ මිල අනුව දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය (දළ) (රුපි: දශලක්ෂ) .. | 1051 | 991 | 1062 | 903 | 848 | 904 | 1051 | 989 | 1066 |
| 6 භාණ්ඩ අපනයන (1) හා සාධක නොවන සේවා (රුපි දශ ලක්ෂ) .. | 2016 | 2011 | 1913 | 2074 | 2071 | 2154 | 2016 | 2013 | 2093 |
| 7 භාණ්ඩ ආනයන (2) හා සාධක නොවන සේවා (රුපි: දශලක්ෂ) .. | 2176 | 2209 | 1969 | 2187 | 2204 | 1989 | 2176 | 2193 | 1979 |
| 8 සාධක මිල අනුව (දළ) ජාතික නිෂ්පාදිතය (3) ප්‍රති ශීර්ෂ වශයෙන් (රුපි:) .. | 607 | 619 | 617 | 577 | 591 | 596 | 607 | 621 | 629 |
| 9 පාරිභෝජන වියදම ප්‍රතිශීර්ෂ වශයෙන් (3) හා වෙළෙඳ මිල අනුව දේශීය ප්‍රාග්ධන සම්පාදනය (දළ) (රුපි.) .. | 680 | 685 | 662 | 664 | 669 | 650 | 680 | 684 | 666 |
| **(ආ) දර්ශක අංක (පාද වර්ෂය 1959 = 100 0)** | | | | | | | | | |
| 1 සාධක මිල අනුව දළ ජාතික නිෂ්පාදිතය .. | 100·0 | 104·8 | 107·4 | 100·0 | 105·3 | 109·1 | 100·0 | 105·1 | 109·4 |
| 2 වෙළෙඳ මිල අනුව පෞද්ගලික පාරිභෝජන වියදම හා දේශීය ප්‍රාග් ධන සම්පාදනය (දළ) .. | 100·0 | 103·6 | 102·8 | 100·0 | 103·7 | 103·4 | 100 0 | 103·4 | 103·5 |
| 3 වෙළෙඳ මිල අනුව පෞද්ගලික පාරිභෝජනය .. | 100·0 | 105·9 | 104·0 | 100·0 | 105·8 | 104·9 | 100·0 | 105·6 | 104·9 |
| 4 වෙළෙඳ මිල අනුව රජයේ පාරිභෝජනය .. | 100·0 | 102·5 | 101·6 | 100·0 | 102·6 | 101·6 | 100·0 | 102·4 | 101·2 |
| 5 වෙළෙඳ මිල අනුව දේශීය ස්ථාවර ප්‍රාග් ධන සම්පාදනය (දළ) .. | 100·0 | 94·3 | 101·0 | 100·0 | 93·9 | 100·1 | 100·0 | 94·1 | 101·4 |
| 6 භාණ්ඩ අපනයන (1) හා සාධක නොවන සේවා .. | 100·0 | 99·8 | 94·9 | 100·0 | 99·9 | 103·9 | 100·0 | 99·9 | 103·8 |
| 7 භාණ්ඩ ආනයන (2) හා සාධක නොවන සේවා .. | 100·0 | 101·5 | 90·5 | 100·0 | 100·8 | 90·9 | 100·0 | 100·8 | 90·9 |
| 8 සාධක මිල අනුව දළ ජාතික නිෂ් පාදිතය (3) ප්‍රතිශීර්ෂ වශයෙන් .. | 100·0 | 102·0 | 101·6 | 100·0 | 102·4 | 103·3 | 100·0 | 102·3 | 103·6 |
| 9 පාරිභෝජන වියදම ප්‍රතිශීර්ෂ වශයෙන් (3) හා වෙළෙඳ මිල අනුව දේශීය ප්‍රාග් ධන සම්පාදනය (දළ) .. | 100·0 | 100·7 | 97·4 | 100·0 | 100·8 | 97·9 | 100·0 | 100·6 | 97·9 |

(1) අපනයන කළ වෙළෙඳ භාණ්ඩ නැ. වි. ස. මිල

සංඛ්‍යා – ශ්‍රී ලංකා මහ බැංකුවෙනි

(2) ආනයන කළ වෙළෙඳ භාණ්ඩ ර ගැ: මිල

(3) පදනම් කොට ගෙන ඇත්තේ පහත දැක්වෙන ජනගහන ඇස්තමේන්තුය

| | 1959 | 1960 | 1961 |
|---|---|---|---|
| මැදි-අවුරුදු ජනගහනය | 9, 625, 000 | 9, 896, 000 | 10, 167, 000 |
| දර්ශක අංක | 100·0 | 102·8 | 105·6 |

මූළ පාරිභෝජන වියදම සහ දළ දේශීය ප්‍රාග් ධන සම්පාදිතය වෙළෙඳ මිල අනුව 11-1 සංඛ්‍යා සටහනේ (අ) 2 වැනි ශීර්ෂයෙන් දක්වා ඇත. පවත්නා මිල අනුව මෙය 1961 දී 1960 සංඛ්‍යාවනට වඩා සියයට 0·7 කින් අඩු විය. 1956 ස්ථාවර මිල අනුව මේ පහළ වැටීම සියයට 0·2 කට අඩුවී ඇති අතර, 1959 ස්ථාවර මිල අනුව එය සියයට 0·1 කින් වැඩි වී ඇත. පාරිභෝජන වියදම සහ දළ දේශීය ප්‍රාග් ධන සම්පාදිතයෙහි ප්‍රතිශීර්ෂ වටිනාකම සලකන විට, පවත්නා මිල අනුව සහ ස්ථාවර මිල අනුව වූ ඇස්තමේන්තු දෙක අනුව, 1961 දී 1960 දීට වඩා සැලකිය යුතු අඩු වීමෙක් ඇති වී තිබෙන බව පැහැදිලි වෙයි.

1961 දී පාරිභෝජනය හා දළ ප්‍රාග්ධන සම්පාදනය සඳහා කැරුණු මූළ වියදම අඩුවූයේ පෞද්ගලික පාරිභෝජන වියදම සැලකිය යුතු ලෙස අඩුවීමෙන් හා රජයේ පාරිභෝජන වියදම[1] මඳ වශයෙන් අඩුවීමේ ප්‍රතිඵලයක් වශයෙනි. අනෙක් අතට දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය 1960 සංඛ්‍යා හා සසඳ බලනවිට, 1961 දී ප්‍රමාණවත්ව වැඩි වී තිබේ. (සටහනේ අ. 5 ශීර්ෂය) මේ වැඩිවීම, පවත්නා මිල අනුව සියයට 7·2 ක් වන අතර 1956 ස්ථාවර මිල අනුව සියයට 6·6 ක් සහ 1959 ස්ථාවර මිල අනුව සියයට 7·8 ක් වෙයි. පාරිභෝජනය හා දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය සඳහා කැරෙන මූළ වියදම වැඩි නොවී එක් මට්ටමක පැවතෙමින් හෝ අඩුවෙමින් හෝ පවත්නා කාලපරිච්ඡේදයක දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනයෙහි වැඩිවීමක් ඇතිවීම සතුටුදායක ලක්ෂණයක් ලෙස සැලකේ. තොග වල[2] ඇති වූ සමහර කැපී පෙනෙන වෙනස්වීම් ගණන් ගත් විට, මූළ ප්‍රාග්ධන සම්පාදිතය (පහළ 11-11 සංඛ්‍යා සටහනේ "ඇ" ශීර්ෂය බලන්න.) 1961 පවත්නා මිල අනුව සියයට 4·6 කින් ද 1956 සහ 1959 ස්ථාවර මිල අනුව පිළිවෙළින් සියයට 4·2 කින් සහ 5·3 කින් ද වැඩි වී ඇත.

භාණ්ඩ හා සේවා සම්බන්ධයෙන්, ජාත්‍යන්තර වෙළෙඳම පැවැති ආකාරය 11-1 සංඛ්‍යා සටහනේ (අ-6), (අ-7) යන ශීර්ෂවලින් දැක්වේ. අපනයන පරිමාව වැඩි වුව ද, අපනයන ඉපැයීම් 1960 ප්‍රමාණයට වඩා 1961 දී තරමක් සීග්‍රයෙන් පහළ වැටිණි. මෙය 1959 මට්ටමට ද වඩා (සියයට 5 කින් පමණ) අඩු විය. සේවා හා භාණ්ඩ අපනයන 1960 දී එතෙක් සටහන් නොවූ ඉතා උසස් මට්ටමකට වැඩි වුව ද, 1961 එය මුදල් ප්‍රමාණයෙන් හා මූර්ත ප්‍රමාණයෙන් පිළිවෙළින් සියයට 11 කින් පමණ ද සියයට 10 කින් පමණද අඩු වී ඇත.

## නිෂ්පාදිතය සහ වියදම මුදලින්

පවත්නා සාධක මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය පිළිබඳ සවිස්තර ඇස්තමේන්තු 11-2 වැනි සංඛ්‍යා සටහනෙහි දැක්වේ.

අපනයන සඳහා[3] කළ නිෂ්පාදනය (අන්තර්ගත ආනයන හැර) 1960 සියයට 2.8 කින් වූ වැඩිවීම හා සසඳනවිට 1961 දී සියයට 2.6 කින් අඩු වී ඇත.

---

1. ලංකාවේ මෙතෙක් පැවති සිරිත අනුගමනය කරමින් සහ එක්සත් ජාතීන්ගේ සම්මතයට අනුව රජයේ සමායතන වල සහ රජයේ සමහර ව්‍යාපාර වල (දුම්රිය සහ විදුලිය) පාරිභෝජනය සහ ප්‍රාග්ධන සම්පාදනය, පෞද්ගලික පාරිභෝජනය සහ පෞද්ගලික ප්‍රාග්ධන සම්පාදනය, යන ශීර්ෂ යටතේ දක්වා ඇත. මේ සමායතන වල සහ රජයේ ව්‍යාපාරවල ප්‍රාග්ධන සම්පාදනය හා පාරිභෝජනය පෞද්ගලික පාරිභෝජනයෙන් හා ප්‍රාග්ධන සම්පාදනයෙන් වෙන්කොට දැක්වීම පහසුවෙන් කළ නොහැක. මෙයට හේතුව මේ සඳහා වක්‍ර ක්‍රම උපයෝගී කර ගැනීමයි. (විශේෂයෙන් පෞද්ගලික ප්‍රාග්ධන සම්පාදනයේදී)

2. පෞද්ගලික අංශයේ දළ ප්‍රාග්ධන සම්පාදනය ඇස්තමේන්තු කිරීමේ දී තේ, රබර් සහ පශු තොගවල ඇතිවූ වෙනස් වීම් ද තක්සේරුවට ගෙන ඇත. රාජ්‍යාංශයේ දළ ප්‍රාග්ධන සම්පාදනය ඇස්තමේන්තු කිරීමේ දී සහතික මිල ක්‍රමය යටතේ ගත් වී තොග වෙනස් වීම් ද තක්සේරුවට ගෙන ඇත.

3. දේශීය අපනයන තොග ගැළපූ විට අපනයන සඳහා කැරුන නිෂ්පාදනයට සමානය.

සංඛ්‍යා සටහන II—2

## පවත්නා සාධක මිල අනුව දළ ජාතික නිෂ්පාදිතය

රුපියල් දශලක්ෂ

| | 1959 | 1960 | 1961 | ප්‍රතිශත වෙනස 1959 න් 1960 ට | ප්‍රතිශත වෙනස 1960 න් 1961 ට |
|---|---|---|---|---|---|
| I අපනයන සඳහා නිෂ්පාදනය | | | | | |
| (i) දේශීය අපනයන නැ. වි. ස. වටිනාකම .. | 1,692 | 1,775 | 1,681 | + 4·9 | — 5·3 |
| තොග වෙනස්වීම්හි වටිනාකම .. | . . . | —37 | +19 | | |
| පාවිච්චි කළ ආනයන භාණ්ඩ අත්හැර .. | —82 | —82 | —86 | | |
| ශුද්ධ නිෂ්පාදනය .. | 1,610 | 1,657 | 1,613 | + 2·9 | — 2·6 |
| (ii) ප්‍රති අපනයන - එකතු කළ වටිනාකම .. | 3 | 2 | 2 | —20·0 | — |
| අපනයනය සඳහා මුළු නිෂ්පාදනය .. | | | | | |
| ශුද්ධ නිෂ්පාදනය .. | 1,613 | 1,659 | 1,615 | + 2·8 | — 2·6 |
| II මෙරට පාවිච්චිය සඳහා නිෂ්පාදනය (ශුද්ධ නිෂ්පාදනය) | | | | | |
| (i) කෘෂිකර්මය, දුම් ඇ. වන ද්‍රව්‍ය පශු සම්පත ධීවර කර්මාන්තය .. | 1,211 | 1,327 | 1,368 | + 9·6 | + 3·1 |
| (ii) කර්මාන්තය (වෙනත් තැනක ඇතුළත් නො කළ) .. | 321 | 354 | 375 | +10·2 | + 5·8 |
| (iii) ප්‍රාග්ධන සංවර්ධනය (භාණ්ඩ හා සේවා) | | | | | |
| (අ) රාජ්‍යාංශය .. | 342 | 314 | 418 | — 8·3 | +33·3 |
| (ආ) පෞද්ගලික අංශය .. | 246 | 249 | 249 | + 1·4 | — 0·1 |
| (iv( නිවාස අයිතිය .. | 144 | 154 | 167 | + 7·5 | + 8·4 |
| (v) වෘත්තීය, පෞද්ගලික හා දේශීය සේවා | 437 | 443 | 450 | + 1·4 | + 1·6 |
| (vi) වෙළෙඳාම (රජයේ නොවන, අපනයන නොවන) .. | 502 | 524 | 486 | + 4·4 | — 7·2 |
| (vii) ප්‍රවහනය (රජයේ නොවන අපනයන නොවන) .. | 307 | 331 | 330 | + 8·0 | — 0·5 |
| (viii) රජයේ වෙ ාත් තැනක ඇතුළත් නොකළ | 759 | 816 | 856 | + 7·6 | + 4·9 |
| එකතුව | 4,268 | 4,513 | 4,699 | + 5·7 | + 4·1 |
| III දළ දේශීය නිෂ්පාදිතය .. | 5,881 | 6,171 | 6,314 | + 4·9 | + 2·3 |
| iv පිටරටින් ලැබූ ශුද්ධ ආදායම .. | —37 | —44 | —40 | | |
| v දළ ජාතික නිෂ්පාදිය .. | 5,844 | 6,127 | 6,274 | + 4·8 | + 2·4 |

**ශීර්ෂ විග්‍රහය**:-

(1) මෙහි රජය යන්නට [ii. (iii) (අ) සහ ii. (viii) යන ශීර්ෂ] රජයේ සමායතන සහ ඇතැම් රජයේ ව්‍යාපාර (උදා:- දුම්රිය හා විදුලි බලය) ඇතුළත් නොවේ. රජයේ මෙම සමායතන සහ ව්‍යාපාරයන්හි ශුද්ධ නිෂ්පාදනය වෙන ශීර්ෂ යටතේ දක්වා ඇත.

(2) II (viii) ශීර්ෂය (වෙනත් තැනක ඇතුළත් නොවන) රජයේ ගොඩනැගිලිවල ආරෝපිත කුලී ඇතුළත්.

(3) රාජ්‍යාංශයේ ප්‍රාග්ධන සංවර්ධනයෙහි ශුද්ධ නිෂ්පාදනයට [II (iii) (අ) ශීර්ෂය] පහත සඳහන් ඒවාද ඇතුළත්

(අ) ශිවිසුම් පිට කැරුන රජයේ ප්‍රාග්ධන කාර්යයන්හි ශුද්ධ නිෂ්පාදනය

(ආ) ප්‍රාග්ධන සංවර්ධනයට අදාළ අමතර සේවා (උදා. රජය ගෙන්වූ ප්‍රාග්ධන භාණ්ඩ පරිවහණය)

(4) පෞද්ගලික අංශයේ II (iii) (ආ) යන ශීර්ෂ ප්‍රාග්ධන සංවර්ධනයෙහි ශුද්ධ නිෂ්පාදනයට ඇතුළත් වනුයේ,

(අ) ගොඩනැගිලි කර්මාන්තවල ශුද්ධ නිෂ්පාදනය

(ආ) ගොඩනැගිලි භාණ්ඩ හා මෙරට පාරිභෝජනය සඳහා වූ අනෙකුත් ප්‍රාග්ධන භාණ්ඩ සාදන කර්මාන්තයන්හි ශුද්ධ නිෂ්පාදනය හා

(ඇ) වැවිලිවල හා නැවත වගාකිරීම්හි ශුද්ධ නිෂ්පාදනය යන ඒවාය.

**සංලක්ෂ්‍යය**:-

(1) පළකල වාර්තා (ලංකා රේගු වාර්තාව වැනි) හා ඇතැම් නියමිත තොරතුරු ලබා ගැනීමේ විශෙෂ මාගී (උදා. කාර්මික නිෂ්පාදනය පිළිබඳව කර්මාන්ත දෙපාර්තමේන්තුව) හැරුණ විට මෙම සටහන (හා දළ ජාතික වියදම් සටහන) සඳහා අවශ්‍ය විස්තර වැඩි හරියක්ම ලැබුනේ ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවෙනි.

(2) සටහන් සංඛ්‍යා ලඟම දශමස්ථානයට ගෙන ඒම නිසා ශීර්ෂ එකතු හා මුළුඑකතු වෙනස් විය හැකිය. (4) 1961 නිෂ්පාදන හා වියදම් ඇස්තමේන්තු තාවකාලිකය.

මෙරට පාවිච්චිය සඳහා කරන ලද නිෂ්පාදනයෙහි 1960 දී ඇති වූ සියයට 5·7 කින් වැඩිවීම හා සසඳන විට 1961 දී එය සියයට 4·1 කින් වැඩි වී ඇත. මෙරට පාවිච්චිය සඳහා කැරුන නිෂ්පාදනයෙහි ඇති වූ සැලකිය යුතු ලක්ෂණයක් වී ඇත්තේ කෘෂිකර්මාන්තය, පශු හා ධීවර නිෂ්පාදනයන්ගේ වැඩිවීමේ වේගය 1960 දී සියයට 9·6 ක් වූවද, 1961 දී එය සියයට 3·1 කට පහළ වැටීමය. මෙයට ප්‍රධාන වශයෙන්ම හේතු වී ඇත්තේ වී වගාව වැඩිවීමේ වේගයෙහි ඇති වූ වෙනස් වීමය. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද ආදර්ශ පරීක්ෂණයකට අනුව, වී වගාව, (බිත්තර වී හැර) 1959 දීට වඩා 1960 දී බුසල් කෝටි 0·78 කින් වැඩි වී ඇත. එහෙත් මේ පදනම උඩම සැකසූ තාවකාලික ඇස්ත-මේන්තු අනුව පෙනී යන පරිදි 1961 දී 1960 දීට වඩා වැඩි වී ඇත්තේ වී බුසල් කෝටි 0·01 කින් බව හෙළි වෙයි. මෙරට ප්‍රයෝජනය සඳහා වූ නිෂ්පාදනයෙහි සැලකිය යුතු දෙවැනි ලක්ෂණය නම් රජය විසින් අරඹා ඇති ප්‍රාග්ධන සංවර්ධන සම්පාදන වැඩිවීමය. 1960 දී සියයට 8·2 කින් වූ අඩුවීම හා සසඳ බලනවිට මෙය 1961 දී සියයට 33·3 කින් වැඩි වී තිබේ. අපනයන සඳහා සහ මෙරට පාවිච්චිය සඳහා කැරුන නිෂ්පාදනය සලකා බලන විට, දළ ජාතික නිෂ්පාදිත 1961 දී සියයට 2·3 කින් වැඩි විය. 1960 වැඩිවීම සියයට 4·9 ක් විය. දළ දේශීය නිෂ්පාදනයේ වැඩිවීමේ සියයට ගණන (දළ දේශීය නිෂ්පාදිතය පිටරටින් ගෙන්වන සාධක ආදායම් සමග ගලපා) 1961 දී සියයට 2·4 ක් වී ඇති අතර, 1960 දී සියයට 4·8 ක් විය.

පවත්නා වෙළෙඳ මිල අනුව, දළ ජාතික වියදම් පිළිබඳ සවිස්තර, ඇස්ත-මේන්තු ප්‍රථම වරට මේ වාර්තාවේ II–3 වැනි සටහනේ දක්වා ඇත. දළ ජාතික වියදම් විග්‍රහ කිරීමේ දී, 1960 සංඛ්‍යාවට වඩා සියයට 5.9 කින් වැඩි වූ පෞද්ගලික පාරිභෝජන වියදම, 1961 දී සියයට 1·8 කින් අඩු වී ඇති බව හෙළිවෙයි. 1959 දීට වඩා 1960 දී සියයට 2·5 කින් වැඩි වූ රජයේ පාරිභෝජනය, 1961 දී සියයට 0.8 කින් අඩු විය. පෞද්ගලික අංශයේ ස්ථාවර ප්‍රාග් ධන සම්පාදනය (රජයේ සමායතන ද ඇතුළුව) 1960 දී සියයට 7.9 කින් අඩු විය. නැවත 1961 දී එය සියයට 1.1 කින් අඩු වී ඇත. පෞද්ගලික අංශය මෙසේ වෙනස් වූවද (රජයේ සමායතන අත්හැර) 1960 සියයට 2.1 කින් අඩු වූ රජයේ ස්ථාවර දළ ප්‍රාග්ධන සම්පාදනය1961දී සියයට 20.3 කින් වැඩි වී ඇත. එහෙත් තොග වෙනස්වීම් ගණන් ගෙන බලන විට පෞද්ගලික අංශයේ මුළු දළ දේශීය ප්‍රාග් ධන සම්පාදනය 1961 දී සියයට 5.9 කින් වැඩි වී ඇති අතර 1960 දී සියයට 14.1 කින් පහළ වැටී තිබිණ. රාජ්‍යාංශයේ මුළු දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය 1961 දී සියයට 2.8 කින් වැඩිවී ඇති අතර 1961 වැඩිවීම සියයට 10.5 ක් විය.

සංඛ්‍යා සටහන II—3

## පවත්නා වෙළෙඳ මිල අනුව දළ ජාතික වියදම

රුපියල් දශ ලක්ෂ

| | 1959 | 1960 | 1961 | ප්‍රතිශත වෙනස 1959 න් 1960 ට | ප්‍රතිශත වෙනස 1960 න් 1961 ට |
|---|---|---|---|---|---|
| I. පෞද්ගලික පාරිභෝජනය | | | | | |
| (අ) භාණ්ඩ හා සාධක නොවන සේවා ආනයන | | | | | |
| (i) ආහාර හා අනෙකුත් පෞද්ගලික පාරිභෝජන භාණ්ඩ ආනයන* .. | 1,774 | 1,831 | 1,615 | + 3·2 | — 11·8 |
| (ii) සාධක නොවන සේවා ආනයන .. | 178 | 152 | 140 | —14·5 | — 7·8 |
| එකතුව | 1,952 | 1,982 | 1,755 | + 1·6 | — 11·5 |
| (ආ) මෙරට නිපදවන භාණ්ඩ හා සේවා | | | | | |
| (i) මෙරට නිපදවන භාණ්ඩ .. .. | 1,863 | 2,033 | 2,128 | + 9·1 | + 4·7 |
| (ii) ගෙවල් කුලී .. .. .. | 160 | 172 | 187 | + 7·5 | + 8·4 |
| (iii) මෙරට සංචාරය .. .. .. | 187 | 198 | 207 | + 6·3 | + 4·1 |
| (iv) සේවා; වෙනත් තැනක ඇතුළත් නොසැල .. | 482 | 492 | 503 | + 2·1 | + 2·2 |
| එකතුව | 2,691 | 2,895 | 3,023 | + 7·6 | + 4·4 |
| (ඇ) අනේවාසිකයන් විසින් මිලදී ගත් භාණ්ඩ සහ සේවා අඩු කොට | —195 | —169 | —153 | —13·5 | — 9·1 |
| මුළු පෞද්ගලික පාරිභෝජනය .. .. | 4,448 | 4,709 | 4,625 | + 5·9 | — 1·8 |
| II. රජයේ පාරිභෝජනය | | | | | |
| (i) භාණ්ඩ හා සේවා සඳහා වර්තන වියදම් - රජයේ .. .. .. | 940 | 968 | 956 | + 3·0 | — 1·2 |
| (ii) භාණ්ඩ හා සේවා සඳහා වර්තන වියදම් පලාත් පාලන ආයතන .. .. | 90 | 87 | 90 | — 3·4 | + 3·8 |
| (iii) රජයේ ගොඩනැගිලි සඳහා ආරෝපිත කුලී .. .. .. | 20 | 21 | 21 | + 5·0 | ... |
| එකතුව .. .. .. | 1,050 | 1,076 | 1,067 | + 2·5 | — 0·8 |
| III. පෞද්ගලික දේශීය ප්‍රාග් ධන සම්පාදනය | | | | | |
| (i) දළ ස්ථිර ප්‍රාග්ධන සම්පාදනය .. | 657 | 605 | 598 | — 7·9 | — 1·1 |
| (ii) තොගවල වෙනස්වීම් (1) .. | + 15 | —27 | + 13 | | |
| එකතුව | 672 | 577 | 611 | —14·1 | + 5·9 |
| IV. රජයේ දේශීය ප්‍රාග් ධන සම්පාදනය | | | | | |
| (i) දළ ස්ථිර ප්‍රාග් ධන සම්පාදනය .. | 394 | 386 | 464 | — 2·1 | +20·3 |
| (ii) තොගවල වෙනස්වීම් (2) .. | — 15 | + 33 | — 33 | | |
| එකතුව | 380 | 420 | 431 | +10·5 | + 2·8 |
| V පිටරට ආයෝජන (ශුඩ) (3) .. .. .. | —208 | —221 | —75 | — 6·0 | —65·8 |
| VI. ජාත්‍යන්තර ත්‍යාග හා පැවරුම් (ශුඩ) අඩු කොට | + 12 | — 22 | —21 | | |
| VII. දළ ජාතික වියදම .. .. .. .. | 6,353 | 6,540 | 6,638 | + 2·9 | + 1·5 |

(සංඛ්‍යා— I—2 සටහනෙහි සංලක්ෂ්‍යය බලන්න)

* සිල්ලර වටිනාකම අනුව

(1) තේ, රබර් හා පශු සම්පත් තොගවල වෙනස්වීම් පමණකි.

(2) සහතික කළ, මිල ක්‍රමය යටතේ වූ වී තොගවල වෙනස පමණකි.

(3) පිටරට අයෝජන - ශුඩ - වර්තන ගිණුමෙහි ජාතිය සඳහා වූ අතිරික්තය.

ජාතික නිෂ්පාදිතය සහ ජාතික වියදම වෙන් වෙන් වශයෙන් ඇස්තමේන්තු කොට සසඳා 11-4 වැනි සංඛ්‍යා සටහනේ දක්වා ඇත.

### සංඛ්‍යා සටහන II—4

## පවත්නා මිල අනුව දළ ජාතික නිෂ්පාදිත වියදම

රුපියල් දශලක්ෂ

| | 1959 | 1960 | 1961 | | 1959 | 1960 | 1961 |
|---|---|---|---|---|---|---|---|
| 1. සාධක මිල අනුව දළ ජාතික නිෂ්පාදිත .. | 5844 | 6127 | 6274 | 4. පාරිභෝජන වියදම පෞද්ගලික .. | 4448 | 4709 | 4625 |
| 2. අනියම් බදු (ආධාර අඩුකොට) .. | 397 | 407 | 384 | 5. පාරිභෝජන වියදම රජයේ .. | 1050 | 1076 | 1067 |
| | | | | 6. දළ දේශීය ප්‍රාග් ධන සම්පාදනය-පෞද්ගලික | 672 | 577 | 611 |
| | | | | 7. දළ දේශීය ප්‍රාග් ධන සම්පාදනය-රජයේ .. | 380 | 420 | 431 |
| | | | | 8. පාරිභෝජනය හා දළ දේශීය ප්‍රාග් ධන සම්පාදනයෙහි වියදම .. | 6549 | 6782 | 6735 |
| | | | | 9. භාණ්ඩ හා සාධක නොවන සේවා අපනයනය .. | 2016 | 2011 | 1913 |
| | | | | 10 භාණ්ඩ හා සාධක නොවන සේවා ආනයන අත්හැර .. | —2176 | —2209 | −1969 |
| | | | | 11. වෙළෙඳ මිල අනුව දළ දේශීය නිෂ්පාදිතයෙහි වියදම .. | 6389 | 6584 | 6679 |
| | | | | 12. පිටරටින් ලැබූ සාධක ආදායම (ශුඩ) .. | — 37 | — 44 | — 40 |
| | | | | 13. ඉතිරි (තොගවල හා සංඛ්‍යා විෂමතාවයන් හි නොදක්වන ලද වෙනස්කම්) .. | — 112 | — 6 | + 20 |
| 3. වෙළෙඳ මිල අනුව දළ ජාතික නිෂ්පාදිතය .. | 6241 | 6534 | 6658 | 14. වෙළෙඳ මිල අනුව දළ ජාතික නිෂ්පාදිතයෙහි වියදම .. | 6241 | 6534 | 6658 |

සංඛ්‍යා - ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

සංලක්ෂ්‍යය:- මෙම සංඛ්‍යා සටහනෙහි 11 හා 12 යන ශීර්ෂයන්හි විජක ඓක්‍යය දළ ජාතික වියදමට සමානය (සංඛ්‍යා සටහන 11 - 3 හි Vii වැනි ශීර්ෂය) මෙය වෙනස් වන්නේ සංඛ්‍යා සටහනෙහි 14 වැනි ශීර්ෂයෙහි (වෙළෙඳ මිල අනුව දළ ජාතික නිෂ්පාදිතය) පමණකි. එයද 13 වැනි ශීර්ෂයෙහි (තොගවල හා සංඛ්‍යා විෂම තාවන්හි නොදක්නා ලද වෙනස්කම්) දක්වා ඇති ප්‍රමාණයෙන් පමණකි.

මේ සටහනේ, 11-12 යන ශීර්ෂවල එකතුව, (වෙළෙඳ මිල අනුව දළ දේශීය නිෂ්පාදිතයට, පිටරටින් ගෙන්වන ලද ශුඩ සාධක ආදායම එකතුව) 11-3 සංඛ්‍යා සටහනේ, vii. ශීර්ෂය (දළ ජාතික වියදම) හා සමානය. තොග වෙනස්වීම් සියල්ලම මුළුමනින් ම ගණන් ගන්නේ නම් හා සංඛ්‍යා වල වෙනස්කම් නොතිබුනේ නම් "වියදම් අනුසාරයෙන් ලබාගත් වෙළෙඳ මිල අනුව වූ දළ ජාතික නිෂ්පාදිත වියදමට මෙ ශීර්ෂ සමාන විමටහැකිව තිබිණි.(මෙහි 14 වැනි ශීර්ෂය "අවශේෂ" යටතේ (ශීර්ෂ 13) එන ගණනින් වෙනස් වෙයි)

1959 සහ 1959 ස්ථාවර මිල අනුව, මූර්ත ජාතික නිෂ්පාදිතයේ සවිස්තර ඇස්තමේන්තු 11-5 වැනි සටහනේ දක්වා ඇත.

## සංඛ්‍යා සටහන II—5

## ස්ථාවර සාධක මිල අනුව දළ ජාතික නිෂ්පාදිතය

රුපියල් දශ ලක්ෂ

| | 1956 ස්ථාවර මිල අනුව | | | | | 1959 ස්ථාවර මිල අනුව | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1959 | 1960 | 1991 | ප්‍රතිශත වෙනස 1959 න් 1960 ට | ප්‍රතිශත වෙනස 1960 න් 1961 ට | 1959 | 1960 | 1961 | ප්‍රතිශත වෙනස 1959 න් 1960 ට | ප්‍රතිශත වෙනස 1960 න් 1961 ට |
| I අපනයන සඳහා නිෂ්පාදනය | | | | | | | | | | |
| (i) දේශීය අපනයන නෑ. වි. ස. මිල අනුව .. .. .. | 1,729 | 1,830 | 1,890 | + 5·8 | + 3·3 | 1,692 | 1,778 | 1,862 | + 5·1 | + 4·7 |
| තොගවල වෙනස්වීම්හි වටිනාකම .. .. .. | + 1 | — 36 | + 21 | | | ... | — 34 | + 21 | | |
| පාවිච්චි කළ ආනයන භාණ්ඩ අඩුකොට .. .. .. | — 89 | — 89 | — 98 | — | + 9·9 | — 82 | — 83 | — 92 | + 1·3 | +10·3 |
| නිෂ්පාදනය (ශුඬ) .. .. .. .. .. | 1,640 | 1,704 | 1,814 | + 3·9 | + 6·4 | 1,610 | 1,660 | 1,791 | + 3·1 | + 7·8 |
| (ii) ප්‍රති අපනයන - එකතු කළ වටිනාකම .. .. .. | 3 | 2 | 2 | —19·2 | ... | 3 | 2 | 2 | —16·0 | ... |
| (iii) අපනයන සඳහාවූ මුළු නිෂ්පාදනය - ශුඬ (ප්‍රමාණය) .. | 1,643 | 1,707 | 1,816 | + 3·9 | + 6·4 | 1,613 | 1,663 | 1,793 | + 3·1 | + 7·8 |
| II දේශීය පාවිච්චිය සඳහා නිෂ්පාදනය - (ශුඬ ප්‍රමාණය) | | | | | | | | | | |
| (i) කෘෂිකර්මය, දූව, ඇතුළු ද්‍රව්‍ය, පශු සම්පත, ධීවර කර්මාන්තය | 1,108 | 1,237 | 1,270 | +11·6 | + 2·7 | 1,211 | 1,351 | 1,388 | +11·6 | + 2·7 |
| (ii) කර්මාන්ත - වෙනත් තැනක ඇතුළත් නොකළ .. .. | 255 | 233 | 225 | — 8·5 | — 3·6 | 321 | 305 | 299 | — 5·2 | — 2·0 |
| (iii) ප්‍රාග් ධන සංවර්ධනය (භාණ්ඩ හා සේවා) රාජ්‍ය අංශය .. | 281 | 259 | 344 | — 8·0 | +33·1 | 342 | 314 | 418 | — 8·3 | +33·2 |
| පෞද්ගලික අංශය .. .. .. .. .. | 206 | 228 | 207 | + 1·0 | — 9·4 | 246 | 274 | 254 | + 1·4 | — 7·3 |
| (iv) නිවාස අයිතිය .. .. .. .. .. | 137 | 149 | 160 | + 9·0 | + 7·2 | 144 | 157 | 167 | + 9·1 | + 6·5 |
| (v) වෘත්තීය, පෞද්ගලික හා ගෘහ සේවා .. .. .. | 420 | 431 | 434 | + 2·5 | + 0·7 | 437 | 448 | 451 | + 2·6 | + 0·7 |
| (vi) වෙළෙඳුම - (රජයේ නොවන අපනයන නොවන) .. | 478 | 506 | 465 | + 5·9 | — 8·2 | 502 | 532 | 488 | + 5·9 | — 8·2 |
| (vii) ප්‍රවාහණය - (රජයේ නොවන - අපනයන නොවන) .. | 308 | 328 | 324 | + 6·5 | — 1·0 | 307 | 327 | 323 | + 6·5 | — 1·0 |
| (viii) රජයේ - (වෙනත් තැනක ඇතුළත් නොවූ) .. .. | 759 | 816 | 856 | + 7·6 | + 4·9 | 759 | 816 | 856 | + 7·6 | + 4·9 |
| එකතුව | 3,951 | 4,188 | 4,285 | + 5·9 | + 2·3 | 4,268 | 4,523 | 4,644 | + 6·0 | + 2·7 |
| III දළ දේශීය නිෂ්පාදනය .. .. .. .. .. | 5,594 | 5,894 | 6,101 | + 5·4 | + 3·5 | 5,881 | 6,185 | 6,437 | + 5·2 | + 4·1 |
| IV පිටරටින් ලැබූ සාධක ආදායම .. .. .. .. | — 37 | — 44 | — 41 | | | — 37 | — 44 | — 41 | | |
| V දළ ජාතික නිෂ්පාදිතය .. .. .. .. .. | 5,557 | 5,850 | 6,060 | + 5·3 | + 3·6 | 5,844 | 6,141 | 6,396 | + 5·1 | + 4·2 |

සංඛ්‍යා - ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

අපනයන සඳහා කැරුන ශුඪ නිෂ්පාදනවල පවත්නා වටිනාකම පසුගිය වර්ෂය හා සසඳන විට 1961 දී අඩු වුවද, මූර්ත වශයෙන් බලන කල අපනයන අංශයේ නිෂ්පාදනය 1961 දී වැඩි වී ඇත. අපනයන සඳහා කැරුන ශුඪ නිෂ්පාදිතය, 1956 ස්ථාවර මිල අනුව බලන කල 1960 ට වඩා 1961 දී සියයට 6 ·4 කින් වැඩිවී ඇත. 1959 ස්ථාවර මිල අනුව, 1961 නිෂ්පාදිතය 1960 නිෂ්පාදිතයට වඩා සියයට 7.8 කින් වැඩිය. 1959 දීට වඩා 1960 දී නිෂ්පාදිතයේ ඇති වූ වැඩිවීම මේ මිල ගණන් අනුව, පිළිවෙලින් සියයට 3.9 ක් සහ සියයට 3.1 ක් වෙයි. එහෙත් ප්‍රධාන වශයෙන් පොල් නිෂ්පාදිතයෙහි ඇතිවූ අති විශේෂ වැඩිවීම නිසා 1961 අපනයන ගණයෙහි මූර්ත නිෂ්පාදිත මෙසේ සැලකිය යුතු ලෙස වැඩිවූව ද, ස්ථාවර මිල අනුව බලන විට නියමිත අපනයන වටිනාකම 1959 සිට 1960 තෙක් වූ වැඩිවීමට වඩා 1960 සිට 1961 වූ වැඩිවීම අඩු වී ඇත. 1956 ස්ථාවර මිල අනුව, දේශීය අපනයන වල වටිනාකම, 1960 දීට වඩා 1961 දී සියයට 3·3 කින් වැඩිය. 1959 ස්ථාවර මිල අනුව සියයට 4.7 කින් වැඩිය. 1959 දීට වඩා 1960 දී ඇතිවූ සමානුරූප වැඩිවීම පිළිවෙළින් සියයට 5.8 ක් සහ 5.1 ක් විය. මූර්ත නිෂ්පාදනයෙහි හා මූර්ත අපනයනයෙහි වෙනස, තොග වෙනස්වීම් වලින් පැහැදිලිවෙයි. 1960 තේ සහ රබර් අපනයන නිෂ්පාදනයට වඩා වැඩි විය. එහෙත් 1961 දී රබර් නිෂ්පාදනය අපනයනයට වඩා වැඩි වූ අතර, තේ තොග මුළුමනින්ම වාගේ නොවෙනස් ව පැවතිණි. මෙරට පාවිච්චිය සඳහා වූ නිෂ්පාදන සම්බන්ධව පවත්නා මිල අනුව, කෘෂිකර්මාන්තය, පශු සහ ධීවර කර්මාන්තය ඇතුළත් ගණයෙහි 1960 හා සසඳා බලන විට 1961 දී ඇති වූ වැඩිවීම ඉහත සඳහන් කැරිණ. ස්ථාවර මිල අනුව, නැවත මිල කිරීමෙන්, වත්‍රුයේ පවත්නා මිල අනුව, ලබාගත් සංඛ්‍යා තිරවීම පමණකි. අදහස් දැක්විය යුතු තවත් වැදගත් ලක්ෂණයක් වත්‍රුයේ 1960 සහ 1961 දී( ගොඩ නැගිලි කර්මාන්තය සහ අපනයන නිෂ්පාදිත නිමැවීමේ කර්මාන්ත හැර,) කර්මාන්තවල, මූර්ත ශුඪ නිෂ්පාදනයෙහි පැහැදිලි ලෙසම ඇතිවූ අඩුවීමයි(1) (II 5 සංඛ්‍යා සටහනේ II (ii) ශීර්ෂය)

වෙළෙඳ අනුපාතයෙහි ඇතිවන වෙනස් වීම් මූර්ත ජාතික ආදායම කෙරෙහි බලපාන අයුරු 11–6 වැනි සංඛ්‍යා සටහනේ විග්‍රහ කොට ඇත.

සංඛ්‍යා සටහන II–6

**ලංකාවේ මූර්ත නිෂ්පාදිතය කෙරෙහි විදේශීය වෙළෙඳ අනුපාතයෙහි බලපෑම**

රුපියල් දශලක්ෂ

| වර්ෂය | මූර්ත ජාතික නිෂ්පාදිතය* | විදේශීය වෙළෙඳ අනුපාතීය බලපෑම | | | | | මූර්ත ජාතික ආදායම* |
|---|---|---|---|---|---|---|---|
| | | තේ | රබර් | පොල් නිෂ්පාදිත | අනිකුත් නිෂ්පාදිත | සියලුම නිෂ්ප දිත | |
| | 1956 සාධක මිල අනුව | | | | | | |
| 1959 | 5,557 | — 101 | — 11 | + 85 | — 3 | — 29 | 5,528 |
| 1960 | 5,850 | — 136 | + 27 | + 48 | + 3 | — 58 | 5,792 |
| 1961 | 6,060 | — 152 | — 35 | — 4 | — 2 | — 193 | 5,867 |
| | 1959 සාධක මිල අනුව | | | | | | |
| 1959 | 5,844 | — | — | — | — | — | 5,844 |
| 1960 | 6,141 | — 26 | + 39 | — 33 | + 6 | — 14 | 6,127 |
| 1961 | 6,396 | — 38 | — 25 | — 111 | + 1 | — 173 | 6,224 |

සංඛ්‍යා - ශ්‍රී ලංකා මහ බැංකුවේ නි

*මූර්ත ජාතික නිෂ්පාදිතය හා මූර්ත ජාතික ආදායම පිළිබඳ සංඛ්‍යා ඝණය වීමකි දළ ප්‍රමාණය වෙයි

(1) මේ පහළ වැටීමට හේතුව දක්වා ඇති කර්මාන්ත වල නියම වර්ධනයෙහි වූ අඩුවක් ද නැතහොත් කාර්මික සම්පාදනය සම්බන්ධව, ඇති සංඛ්‍යා තොරතුරු වල ඌනතාවය නිසා ද යන්න නියම වශයෙන් කිව නොහැකිය.

ස්ථාවර මිල අනුව වූ ඇස්තමේන්තු අනුව, දළ ජාතික නිෂ්පාදිතය 1960 දීට වඩා 1961 දී සියයට 4 කින් පමණ වැඩිවී ඇති බවක් හෙළි වුවද 1961 මූර්ත ජාතික ආදායම වැඩිවීම බොහෝ සෙයින් අඩුය. මෙයට හේතු වූයේ අවාසි සහගත වෙළෙඳ අනුපාතයක් ඇතිවීමයි. මේ අනුව නියමිත ආනයන පරිමාවක් සඳහා අපනයන මගින් ගෙවිය යුතු මූර්ත වියදම, 1960 දීට වඩා 1961 දී වැඩිවිය. වෙළෙඳ අනුපාතයේ ඇති වූ මේ පිරිහීම සඳහා ඉඩගළ පසු ලංකාවේ සම්පත් වර්ග වලින් ලැබෙන ජාතික නිෂ්පාදන වටිනාකම, හෙවත් ලංකාවේ මූර්ත ජාතික ආදායම 1956 ස්ථාවර මිල අනුව ඇස්තමේන්තු කරන විට වැඩි වී ඇත්තේ සියයට 1·3 කින් පමණකි. 1959 ස්ථාවර මිල අනුව එහි වැඩිවීම සියයට 1·6 කි. 1959 හා 1960 අතර කාලය තුළ ද වෙළෙඳ අනුපාතය මඳ වශයෙන් පිරිහී ඇත. එහෙත් 1960 දී ලංකාවේ මූර්ත ආදායමේ වර්ධනය 1956 සහ 1959 ස්ථාවර මිල අනුව, සියයට 4·8 ක් විය. මෙය හොඳටම ප්‍රමාණවත් වර්ධනයෙකි.

මුළු වෙළෙඳ අනුපාතය, ඒ ඒ අපනයන ගණ කෙරෙහි බලපා ඇති අන්දම ** වෙන් වෙන් වශයෙන් බෙදු (තේ, රබර්, පොල් නිෂ්පාදිත සහ අනෙකුත් නිෂ්පාදිත) II–6 වැනි සටහනේ දක්වා ඇත.

ස්ථාවර වෙළෙඳ මිල අනුව පෞද්ගලික සහ රජයේ පාරිභෝජනය පිළිබඳ විස්තර ඇස්තමේන්තු සහ පෞද්ගලික සහ රජයේ දේශීය ප්‍රාග්ධන සම්පාදනය පිළිබඳ සවිස්තර ඇස්තමේන්තු II–7 වැනි සංඛ්‍යා සටහනේ දක්වා ඇත. පෞද්ගලික පාරිභෝජනයෙහි අන්තර්ගතවන ආනයන ශීර්ෂ අඩු වී ඇති බව 1 (අ) ශීර්ෂයෙන් පැහැදිළි වෙයි. මෙහි දැක්වෙන පරිදි, ආහාර ආනයන සහ සාධක නොවන සේවාවන්හි සිල්ලර මිල 1961 දී දළ වශයෙන්සියයට 10 කින් අඩු වූ අතර, 1960 දී එය සියයට එකකට වඩා වැඩි වී ඇත. මූර්ත වශයෙන් බලන කල 1961 දී මුළු පෞද්ගලික පාරිභෝජනය සියයට එකකට මඳක් අඩුවෙන් පහළ වැටී ඇත. එහෙත් 1960 දී මෙය සියයට 5½ කට වැඩියෙන් ඉහළ ගොස් ඇත. රජයේ පාරිභෝජනයේ මූර්ත වටිනාකම ද 1961 දී සියයට 1 කින් පමණ අඩු වී ඇති අතර, 1960 දී මෙය සියයට 2½ කින් පමණ වැඩිවිය. අනෙක් අතට පෞද්ගලික අංශයේ දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය (රජයේ සමායතන ඇතුළුව) 1956 ස්ථාවර මිල අනුව 1961 දී සියයට 6·8 කින් ද 1959 ස්ථාවර මිල අනුව සියයට 5·9 කින් ද වැඩිවිය. 1960 දී මෙය පිළිවෙලින් සියයට 15·0 කින් හා සියයට 13·4 කින් පහළ වැටිණි. අවුරුදු දෙක අතර ඇති වූ මේ වාසි සහගත වෙනස්වීම බොහෝ සෙයින්ම තොග වෙනස්වීම නිසා ඇතිවූවාවිය හැකිය. 1961 දී වෙන් වෙන් වශයෙන් දැක්විය හැකි තොග වැඩි වූ අතර, 1960 දී එය පහළ වැටිණි. තොග වෙනස්වීම් අත්හළවිට පෞද්ගලික අංශයේ දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය 1956 ස්ථාවර මිල අනුව 1961 දී සියයට 2·3 කින් ද 1959 ස්ථාවර මිල අනුව සියයට 1·4 කින් ද අඩු විය. 1960 දී අනුරූප අඩුවීම පිළිවෙලින් සියයට 7·6 ක් සහ 7·3 ක් විය. 1961 රාජ්‍ය අංශයේ දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය 1960 දී වූ වැඩිවීමට වඩා අඩුය.මෙයේ රජයේ දේශීය ප්‍රාග්ධන සම්පාදන සංසංදනයේ දී සහතික මිල ක්‍රමයට ගනු ලබන වී තොගවල වෙනස්වීමද සැලකිල්ලට ගත යුතුය. මේ තොග 1960 දී වැඩි වුවද, 1961 දී අඩුවිය. මේ තොග වෙනස්වීම අත්හළ විට, රාජ්‍ය අංශයේ දළ දේශීය ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය 1961 දී සැලකිය යුතු ලෙස වැඩි විය. මේ වැඩිවීම 1956 ස්ථාවර මිල අනුව සියසට 21·5 ක්වූ අතර, 1959 ස්ථාවර මිල අනුව සියයට22·3 ක් විය. එහෙත් 1960 දී මෙය 1956 ස්ථාවර මිල අනුව සියයට 3·2 කින් අඩු වී ඇති අතර, 1959 ස්ථාවර මිල අනුව සියයට 3·6 කින් අඩුවිය.

---

** මෙය සකසා ඇත්තේ එක් වර්ගයක අපනයන ප්‍රමාණයක් ස්ථාවර මිල අනුව තක්සේරු කොට එය පවත්නා මිලට වූ සමාන අපනයන ප්‍රමාණයන් සමග සසඳ එම තක්සේරුව ස්ථාවර මිලට තක්සේරු කොට ඒ හාම සැසඳීමෙනි

## සංඛ්‍යා සටහන II—7

## ස්ථාවර වෙළඳ මිල අනුව පාරිභෝජනයෙහි දළ දේශීය ප්‍රාග් ධන සම්පාදනයෙහි වියදම

රුපියල් දශ ලක්ෂ

| | 1956 ස්ථාවර මිල | | | ප්‍රතිශත වෙනස | | 1959 ස්ථාවර මිල | | | ප්‍රතිශත වෙනස | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1959 | 1960 | 1961 | 1959 ත් 1960 ට | 1960 ත් 1961 ට | 1959 | 1960 | 1961 | 1959 ත් 1960 ට | 1960 ත් 1961 ට |
| 1. පෞද්ගලික පාරිභෝජනය | | | | | | | | | | |
| (අ) ආහාර හා සාධක නොවන සේවා ආනයන | | | | | | | | | | |
| (i) ආහාර හා අනෙකුත් පෞද්ගලික පාරිභෝජන භාණ්ඩ ආනයන* .. | 1,817 | 1,871 | 1,671 | + 3·0 | — 8·1 | 1,774 | 1,825 | 1,649 | + 2·9 | — 9·7 |
| (ii) සාධක නොවන සේවා ආනයන .. | 178 | 152 | 141 | —15·0 | — 6·8 | 178 | 151 | 141 | —15·0 | — 6·8 |
| එකතුව | 1,995 | 2,022 | 1,812 | + 1·4 | —10·4 | 1,952 | 1,976 | 1,790 | + 1·3 | — 9·4 |
| (ආ) මෙරට නිෂ්පාදන භාණ්ඩ හා සේවා | | | | | | | | | | |
| (i) මෙරට නිෂ්පාදන භාණ්ඩ .. | 1,840 | 2,010 | 2,138 | + 9·3 | + 6·4 | 1,863 | 2,024 | 2,135 | + 8·7 | + 5·5 |
| (ii) නිවාස කුළී .. | 153 | 167 | 179 | + 9·2 | + 7·0 | 160 | 175 | 187 | + 9·3 | + 7·0 |
| (iii) මෙරට සංචාරය .. | 187 | 196 | 203 | + 4·8 | + 3·5 | 187 | 196 | 203 | + 4·8 | + 3·5 |
| (iv) සේවා - වෙනත් තැනෙක ඇතුලත් නොකළ | 461 | 478 | 483 | + 3·6 | + 1·1 | 482 | 499 | 504 | + 3·6 | + 1·1 |
| එකතුව | 2,641 | 2,851 | 3,003 | + 7·9 | + 5·3 | 2,691 | 2,894 | 3,030 | + 7·5 | + 4·7 |
| (ඇ) අනේවාසිකයන් විසින් මිල දී ගත් භාණ්ඩ හා සේවා අඩුකොට .. | — 186 | — 163 | — 147 | —12·1 | —10·2 | — 195 | — 171 | — 154 | —12·1 | —10·3 |
| මුළු පෞද්ගලික පාරිභෝජනය .. | 4,451 | 4,710 | 4,668 | + 5·8 | — 0·9 | 4,448 | 4,699 | 4,466 | + 5·6 | — 0·7 |
| 2. රජයේ පාරිභෝජනය | | | | | | | | | | |
| (i) භාණ්ඩ හා සේවා සඳහා වර්තන වියදම් - රජය .. (ii) භාණ්ඩ හා සේවා සඳහා වර්තන වියදම් - පළාත් පාලන ආයතන .. | 1,016 | 1,043 | 1,032 | + 2·7 | — 1·0 | 1,030 | 1,054 | 1,042 | + 2·4 | — 1·1 |
| (iii) රජයේ ගොඩනැගිලි සඳහා ආරෝපිත කුළී .. | 20 | 21 | 21 | + 5·0 | + 0·5 | 20 | 21 | 21 | + 5·0 | + 0·5 |
| එකතුව | 1,036 | 1,063 | 1,053 | + 2·7 | — 1·0 | 1,050 | 1,075 | 1,063 | + 2·4 | —1·1 |
| 3. පෞද්ගලික දේශීය ප්‍රාග්ධන සම්පාදනය | | | | | | | | | | |
| (i) දළ ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය .. | 576 | 532 | 520 | — 7·6 | — 2·3 | 657 | 609 | 601 | — 7·3 | — 1·4 |
| (ii) තොගවල වෙනස්වීම් .. | + 15 | — 30 | + 17 | | | + 15 | — 27 | + 15 | | |
| එකතුව | 591 | 502 | 537 | —15·0 | + 6·8 | 672 | 582 | 616 | —13·4 | + 5·9 |
| 4. රජයේ දේශීය ප්‍රාග්ධන සම්පාදනය | | | | | | | | | | |
| (i) දළ ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය .. | 326 | 316 | 384 | — 3·2 | +21·5 | 294 | 380 | 465 | — 3·6 | +22·3 |
| (ii) සහතික කළ මිල ක්‍රමය යටතේ තොගවල වෙනස්වීම් | — 15 | + 33 | — 33 | | | — 15 | + 33 | — 33 | | |
| එකතුව | 312 | 349 | 351 | +12·1 | + 0·4 | 380 | 413 | 432 | + 8·9 | + 4·4 |
| පාරිභෝජනයෙහි හා දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනයෙහි වියදම | 6,389 | 6,625 | 6,609 | + 3·7 | — 0·3 | 6,549 | 6,769 | 6,776 | + 3·4 | + 0·1 |

* සිල්ලර මිල අනුව

සංඛ්‍යා - ශ්‍රී ලංකා මහ බැංකුවෙනි

## සම්පත් මාර්ග හා ප්‍රයෝජන

දේශීය නිෂ්පාදන මාර්ගයන්ගෙන් සහ ජාත්‍යන්තර වෙළෙඳමෙන් ආර්ථික සංවර්ධනයට උපයෝගී කරගත හැකි ධන මාර්ගවල වාර්ෂික වෙනස්වීමේ සියයට ගණන 11-8 වැනි සංඛ්‍යා සටහනේ දක්වා ඇත.

සංඛ්‍යා සටහන II-8

### පවත්නා වෙළෙඳ මිල අනුව ධන මාර්ග හා ඒවා උපයෝගිකර ගැනීම

රුපියල් දශ ලක්ෂ

| | 1959 | 1960 | 1961 | ප්‍රතිශත වෙනස | |
|---|---|---|---|---|---|
| | | | | 1959න් 1960 ට | 1960 න් 1961 ට |
| අ. ධන මාර්ග | | | | | |
| දළ දේශීය නිෂ්පාදිතය* .. | 6,389 | 6,584 | 6,679 | + 3·0 | + 1·4 |
| භාණ්ඩ හා සාධක නොවන සේවා අපනයන .. | 2,176 | 2,209 | 1,969 | + 1·5 | —10·8 |
| එකතුව .. | 8,565 | 8,792 | 8,647 | + 2·7 | — 1·6 |
| ආ. උපයෝගී කර ගැනීම | | | | | |
| පාරිභෝජනය .. | 5,497 | 5,785 | 5,692 | + 5·2 | — 1·6 |
| දළ ප්‍රාග් ධන සම්පාදනය .. | 1,052 | 997 | 1,043 | — 5·2 | + 4·6 |
| භාණ්ඩ හා සාධක නොවන සේවා අපනයන .. | 2,016 | 2,011 | 1,913 | — 0·3 | — 4·9 |
| එකතුව .. | 8,565 | 8,792 | 8,647 | + 2·7 | — 1·6 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

* මෙය II - 2 සටහනේ 111 වැනි ශීර්ෂයයි. වියදම අනුව පාරිභෝගික ඇස්තමේන්තුවල හා ප්‍රාග් ධන සම්පාදනයට ද සරිලන සේ ආධාරවලින් නොවන (II - 4 වැනි සටහනේ 2 වැනි ශීර්ෂය) අවක්‍ර බදු වලට හා සංඛ්‍යාවල භාණ්ඩ විෂමතාවන්හි නොදක්නා ලද වෙනස්කම් සමග සංඛ්‍යා වෙනස්කම් වලට ද, (11 - 4 වැනි සටහනේ 13 වැනි ශීර්ෂය) ගලපා ඇත.

එසේම පාරිභෝජනය; ප්‍රාග්ධන සම්පාදනය සහ අපනයන වශයෙන් මේ ධන මාර්ග යෙදවීමේ දී ඇති වූ වෙනස් වීමේ සියයට ගණනද එනම් පාරිභෝජනය, ප්‍රාග්ධන සම්පාදනය හා ආනයන එම සටහනේ දැක්වේ. 1960 වර්ෂය හා සසඳනවිට 1961 නිෂ්පාදනයට උපයෝගී කොට ගත හැකි ආනයන භාණ්ඩ ප්‍රමාණය සැලකිය යුතු ලෙස අඩු වූ බව සඳහන් කළ යුතුය. භාවිතීය අංශයේ දළ ප්‍රාග්ධන සම්පාදනය වැඩි වූ අතර, පාරිභෝජනය හා අපනයන අඩුවිය.

පවත්නා නිෂ්පාදන මාර්ග වලින් ලැබෙන නිෂ්පාදනය රජයේ පෞද්ගලික අංශයේ පාරිභෝජනය හා ප්‍රාග්ධන සම්පාදනය සඳහා වැය වන මුළු වියදම පියවා ගැනීමට ප්‍රමාණවත් ද යන්න 11–9 වැනි සටහනින් පරීක්ෂා කැරේ.

## සංඛ්‍යා සටහන II—9

### පාරිභෝජනයෙහි හා දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනයෙහි වියදම හා ධනමාර්‍ග පවත්නා වෙළෙඳ මිල අනුව

| | 1959 | | 1960 | | 1961 | |
|---|---|---|---|---|---|---|
| | රුපියල් දශලක්ෂ | 6 වැනි පේළියේ ප්‍රති ශතය | රුපියල් දශලක්ෂ | 6 වැනි පේළියේ ප්‍රති ශතය | රුපියල් දශලක්ෂ | 6 වැනි පේළියේ ප්‍රති ශතය |
| 1 පාරිභෝජන වියදම්-පෞද්ගලික | 4,448 | 70·0 | 4,709 | 72·0 | 4,625 | 69·7 |
| 2 පාරිභෝජන වියදම්-රාජ්‍ය .. | 1,050 | 16·5 | 1,076 | 16·5 | 1,067 | 16·1 |
| 3 දළ දේශීය ප්‍රාග්ධන සම්පාදන වියදම - පෞද්ගලික .. | 672 | 10·6 | 577 | 8·8 | 611 | 9·2 |
| 4 දළ දේශීය ප්‍රාග්ධන සම්පාදන වියදම - රාජ්‍ය .. | 380 | 6·0 | 420 | 6·4 | 431 | 6·5 |
| 5 පවත්නා වෙළෙඳ මිල අනුව පාරිභෝජනයෙහි හා දළ ප්‍රාග්ධන සම්පාදනයෙහි වියදම .. | 6,549 | 103·1 | 6,782 | 103·7 | 6,735 | 101·5 |
| 6 දළ ජාතික නිෂ්පාදනය (ගැලපූ)* . | 6,353 | 100·0 | 6,540 | 100·0 | 6,638 | 100·0 |
| 7 පහත දැක්වෙන ශීර්ෂයන්ගෙන් පිරිමැසූ (6) ට වැඩියෙන් වූ (5) ගේ අධිකය | | | | | | |
| (අ) පිටරට ශුඩ අනායෝජන | 208 | 3·3 | 221 | 3·4 | 75 | 1·1 |
| (ආ) ජාත්‍යන්තර ත්‍යාග හා පැවරුම්වලින් ලැබීම්-ශුඩ .. | —12 | —0·2 | 22 | 0·3 | 21 | 0·3 |
| (අ) + (ආ) .. | 196 | 3·1 | 242 | 3·7 | 96 | 1·5 |

සංඛ්‍යා – ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

* දළ ජාතික වියදම් සටහනින් (සටහන II - 3) ගත් මෙම සටහනෙහි අනෙකුත් ශීර්ෂයන්ට අනුකූලවීම සඳහා II-4 සටහනෙහි 3 වැනි ශීර්ෂයෙහි පවත්නා වෙළෙඳ මිල අනුව දක්වා ඇති දළ ජාතික නිෂ්පාදිත සංඛ්‍යා, එම සටහනෙහි 13 වැනි ශීර්ෂයෙන් ගලපා සකස් කරන ලදී.

පාරිභෝජනය හා ප්‍රාග්ධන සම්පාදනය සඳහා යෙදවීමට දළ ජාතික නිෂ්පාදනය මඳවන්නේ නම් ඒ හිඟය ජාත්‍යන්තර පරිත්‍යාග හා පැවරීම් මඟින් හෝ පිටරට ඇති ආයෝජන ලබා ගැනීමෙන් හෝ පියවා ගත යුතුය. (විදේශීය වත්කම් අඩුකර ගැනීමෙන් හෝ විදේශීය වගකීම් වැඩි කර ගැනීමෙන්) 1959 සිට 1961 තෙක්වූ තුන් අවුරුදු කාලය තුළ පාරිභෝජනයට හා ප්‍රාග්ධන සම්පාදනයට වැඩි වූ මුළු වියදම දළ ජාතික නිෂ්පාදිත ඉක්මවා ගියේය. එහෙත් 1961 දී මුල් වර්ෂ දෙකේ දී පමණටම මේ හිඟය ඇති වූයේ නොවේ. 1961 පාරිභෝජනය හා දළ ප්‍රාග්ධන සම්පාදිතය සඳහා වූ වියදම් හිඟය පියවා ගැනීමට දළ ජාතික නිෂ්පාදිතයෙන් සියයට 1·1 කට සමාන මුදලක් පිටරට ආයෝජනවලින් ගෙන ඇත. 1960 දී මෙය සියයට 3·4 ක්වූ අතර, 1959 දී මෙය සියයට 3·3 ක් විය. පාරිභෝජනය හා දළ ජාතික ප්‍රාග්ධන සම්පාදන සඳහා වූ මුළු වියදම් දළ ජාතික නිෂ්පාදිතය ඉක්මවා ගියේ හිඟය පියවා ගැනීමට 1960 සහ 1961 දී ජාත්‍යන්තර පරිත්‍යාග සහ පැවරීම් ද මඳ වශයෙන් උදව් විය. (වර්ෂයකට දළ ජාතික නිෂ්පාදිතයෙන් සියයට 0·3 ක් පමණ) එහෙත් 1959 මේ සම්බන්ධයෙන් මඳ වශයෙන් (ශුද්ධ) ධන මෙරටින් පිටට ඇදී ගොස් ඇත. මේ අවුරුද්දේ ජාත්‍යන්තර පරිත්‍යාග හා පැවරීම් සම්බන්ධයෙන් දළ ජාතික නිෂ්පාදිතයෙන් සියයට 0·2 ක් පිටරටට ගෙවා ඇත. 1961 දී පිටරට ආයෝජනයන් අඩුවෙන් පහළ වැටුනේ ප්‍රධාන වශයෙන් 1961 මුල් භාගයේ දී පනවන ලද ආනයන සීමා කිරීම්නිසාය.

ධන මාර්ග උපයෝගී කරගෙන ඇති පිළිවෙළ 11–9 වැනි සංඛ්‍යා සටහනින් පැහැදිලි කැරේ. එහි පෞද්ගලික හා රජයේ පාරිභෝජන හා ප්‍රාග්ධන සම්පාදන වියදම ද දළ ජාතික නිෂ්පාදිතයේ සියයට ගණන් වශයෙන් දක්වා ඇත. 1960 දී පාරිභෝජනය සඳහා අධික ලෙස වියදම් කර ඇති බවට තරමක් සාක්ෂි ඇත. මේ වර්ෂයේ දළ ජාතික නිෂ්පාදිතයෙන් සියයට 88·5 ක් පාරිභෝජනය සඳහා වැය වී ඇත. 1959 දී මෙය සියයට 86·5 ක්ද, 1961 දී සියයට 85·8 ක්ද වී තිබේ.

මේ සියලුම වියදම් ඇස්තමේන්තු දක්වා ඇත්තේ සිල්ලර මිල ගණන් අනුවය. මෙරටට ගෙන්වූ භාණ්ඩ හා සේවා පාරිභෝජනය පහළ වැටීමත්, සමග පොල් මිල පහළ වැටීම නිසා පාරිභෝජනයට යෙදවූ පොල් නිෂ්පාදිතවල වටිනාකම ද (සිල්ලර) අඩු වූ බව පෙනේ. එසේම වෛද්‍ය, නීති හා අනෙකුත් වෘත්තීය සේවා වියදම් ද අඩු වී ඇත. ඉහත සඳහන් කළ පරිදි පාරිභෝජනයට ගැනෙන කාර්මික භාණ්ඩ මූර්ත ශුද්ධ නිෂ්පාදනය 1960 දී සහ 1961 දී අඩුවීම නිසා මේ සටහනෙහි දැක්වෙන පරිදි, කාර්මික නිෂ්පාදනවල සිල්ලර වටිනාකම වැඩි වී ඇත්තේ ප්‍රධාන වශයෙන් එහි මිල වැඩිවීම නිසාය.

පෞද්ගලික පාරිභෝජන වියදම, මෙරටට ගෙන්වනු ලබන භාණ්ඩ හා සේවා සඳහා යන වියදම් අනුව ද මෙරට නිපදවන භාණ්ඩ හා සේවා සඳහා යන වියදම් අනුවද, සවිස්තරව වර්ග කොට 11-10 සටහනෙහි දක්වා ඇත.

සංඛ්‍යා සටහන II—10

## පවත්නා වෙළෙඳ මිල අනුව පෞද්ගලික පාරිභෝජන වියදම් සැකසුම

රුපියල් දශලක්ෂ

| | 1959 | 1960 | 1961 | ප්‍රතිශත වෙනස 1959 න් 1960 ට | ප්‍රතිශත වෙනස 1960 න් 1961 ට |
|---|---|---|---|---|---|
| (අ) භාණ්ඩ හා සාධක නොවන සේවා ආනයන .. .. .. . | 1,952 | 1,982 | 1,755 | + 1·6 | — 11·5 |
| (ආ) මෙරට නිෂ්පාදිත භාණ්ඩ හා සේවා | | | | | |
| i මෙරට නිෂ්පාදිත භාණ්ඩ .. .. | | | | | |
| හාල් .. .. .. .. | 285 | 300 | 311 | + 5·5 | + 3·8 |
| පොල් නිෂ්පාදිත .. .. | 198 | 172 | 146 | —13·2 | —15·3 |
| තේ .. .. .. .. | 59 | 64 | 65 | + 7·4 | + 2·2 |
| අනෙකුත් ආහාර බෝග .. .. | 398 | 438 | 475 | + 9·9 | + 8·6 |
| දුම්කොළ .. .. .. | 20 | 20 | 21 | ... | + 5·0 |
| බුලත් පුවක් .. .. .. | 46 | 50 | 50 | + 7·4 | ... |
| දර .. .. .. .. | 14 | 16 | 17 | + 9·7 | + 4·4 |
| පශු සම්පත .. .. .. .. | 159 | 160 | 172 | + 0·3 | + 7·6 |
| මාළු .. .. .. .. | 83 | 94 | 106 | +14·0 | +12·2 |
| විවිධ කෘෂිකාර්මික හා දුව ඇඹුල් ද්‍රව්‍ය | 51 | 59 | 61 | + 9·5 | + 3·1 |
| කාර්මික නිෂ්පාදිත .. .. | 589 | 706 | 748 | +19·9 | + 5 9 |
| රජය විසින් මිලදී ගත් භාණ්ඩ අඩුකොට | — 42 | — 45 | — 44 | | |
| එකතුව .. | 1,863 | 2,033 | 2,128 | + 9·1 | + 4·7 |
| ii. ගෙවල් කුලී .. .. . | 160 | 172 | 187 | + 7·5 | + 8·4 |
| iii. මෙරට සංචාරය .. .. .. | 187 | 198 | 207 | + 6·3 | + 4·1 |
| iv. සේවා— වෙනත් තැනක ඇතුළත් නොවූ | | | | | |
| ගෘහ .. . .. .. | 200 | 203 | 209 | + 1·5 | + 3·1 |
| හෝටල් හා ආපන ශාලා ආදිය .. | 119 | 121 | 125 | + 1·5 | + 3·1 |
| වෛද්‍ය, නීති, අධ්‍යාපනික මූල්‍ය ආදිය .. | 55 | 55 | 52 | ... | — 5·8 |
| පුවත්පත් හා අනෙකුත් කියවන ද්‍ර | 23 | 26 | 28 | +14·1 | + 6·2 |
| සංග්‍රහ .. .. .. .. | 35 | 36 | 37 | + 2·9 | + 2·8 |
| අනෙකුත් පෞද්ගලික .. .. .. | 50 | 51 | 52 | + 1·4 | + 3·2 |
| එකතු | 482 | 492 | 503 | + 2·1 | + 2·2 |
| මුළු එකතුව .. | 2,691 | 2,895 | 3,023 | + 7·6 | + 4·4 |
| (ඇ) අනේවාසිකයන් විසින් මිලදී ගත් භාණ්ඩ හා සේවා අඩුකොට .. .. | — 195 | — 169 | — 153 | | |
| මුළු පෞද්ගලික පාරිභෝජනය .. .. | 4,448 | 4,709 | 4,625 | + 5·9 | — 1·8 |

සංඛ්‍යා—ශ්‍රී ලංකා මහ බැංකුවෙනි

දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය පවත්නා මිල අනුව, හා 1956 ස්ථාවර මිල හා 1959 ස්ථාවර මිල අනුව විග්‍රහ කොට II–11 සටහනින් දක්වා ඇත.

සංඛ්‍යා සටහන II—11

## දළ දේශීය ප්‍රාග් ධන සම්පාදනය

රුපියල් දශ ලක්ෂ

| | පවත්නා මිල | | | | | 1956 ස්ථාවර මිල | | | | | 1959 ස්ථාවර මිල | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1959 | 1960 | 1961 | ප්‍රතිශත වෙනස 1959 න් 1960 ට | ප්‍රතිශත වෙනස 1960 න් 1961 ට | 1959 | 1960 | 1961 | ප්‍රතිශත වෙනස 1959 න් 1960 ට | ප්‍රතිශත වෙනස 1960 න් 1961 ට | 1959 | 1960 | 1961 | ප්‍රතිශත වෙනස 1959 න් 1960 ට | ප්‍රතිශත වෙනස 1960 න් 1961 ට |
| (අ) පෞද්ගලික ප්‍රාග්ධන සම්පාදනය | | | | | | | | | | | | | | | |
| 1 දළ ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය | | | | | | | | | | | | | | | |
| වැවීම හා නැවත වැවීම .. .. .. | 54 | 52 | 56 | — 2·8 | + 6·9 | 50 | 47 | 50 | — 6·2 | +6·9 | 54 | 50 | 54 | — 6·5 | + 7·0 |
| ගොඩනැගිලි හා අනෙකුත් ගොඩනැගිලි කර්මාන්ත .. .. .. .. | 324 | 335 | 329 | + 3·4 | — 1·8 | 272 | 284 | 314 | + 4·4 | +10·5 | 324 | 338 | 373 | + 4·4 | +10·5 |
| යන්ත්‍ර හා යන්ත්‍රොපකරණ .. .. | 106 | 81 | 109 | —23·8 | +35·1 | 92 | 61 | 70 | —33·6 | —14·1 | 106 | 70 | 80 | —33·6 | +14·2 |
| ප්‍රවාහණය .. .. .. .. | 119 | 82 | 56 | —30·6 | —32·0 | 112 | 92 | 44 | —18·6 | —52·1 | 119 | 97 | 46 | —18·5 | —48·9 |
| ආනයනය කළ ප්‍රාග්ධන භාණ්ඩ (වෙනත් තැනක ඇතුළත් නොකළ) .. | 55 | 55 | 49 | ... | —11·8 | 50 | 49 | 43 | — 1·4 | —12·5 | 55 | 54 | 47 | — 1·6 | —12·5 |
| එකතුව | 657 | 605 | 598 | — 7·9 | — 1·1 | 576 | 532 | 520 | — 7·6 | — 2·3 | 657 | 609 | 601 | — 7·3 | — 1·3 |
| 2 තොගවල වෙනස | | | | | | | | | | | | | | | |
| තේ .. .. .. .. .. | + 3 | —10 | — | | | + 3 | —11 | — | | | + 3 | —10 | — | | |
| රබර් .. .. .. .. .. | — 2 | —27 | +19 | | | — 3 | —25 | +21 | | | — 2 | —24 | +21 | | |
| පශු සම්පත .. .. .. .. | +15 | +9 | — 5 | | | +14 | + 6 | — 5 | | | +15 | + 7 | — 5 | | |
| එකතුව | +15 | —27 | +13 | | | +15 | —30 | +17 | | | +15 | —27 | +15 | | |
| මුළු එකතුව | 672 | 577 | 611 | —14·1 | + 5·9 | 591 | 502 | 537 | —15·0 | + 6·8 | 672 | 582 | 616 | —13·4 | + 5·9 |
| (ආ) රජයේ ප්‍රාග්ධන සම්පාදනය | | | | | | | | | | | | | | | |
| i දළ ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය .. | 394 | 386 | 464 | — 2·1 | +20·2 | 326 | 316 | 384 | — 3·2 | +21·5 | 394 | 380 | 465 | — 3·6 | +22·3 |
| ii සහතික කළ මිල ක්‍රමය යටතේ වී තොගවල වෙනස්වීම් .. .. | —15 | +33 | —33 | | | —15 | + 33 | —33 | | | —15 | +33 | —33 | | |
| එකතුව | 380 | 420 | 431 | +10·5 | + 2·8 | 312 | 349 | 351 | +12·1 | + 0·4 | 380 | 413 | 432 | + 8·9 | + 4·4 |
| (ඇ) දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය .. | 1052 | 997 | 1043 | — 5·2 | + 4·6 | 903 | 852 | 887 | — 5·5 | + 4·2 | 1052 | 995 | 1048 | — 5·4 | + 5·3 |

සංඛ්‍යා - ශ්‍රී ලංකා මහ බැංකුවෙනි

දක්වා ඇති සවිස්තර ඇස්තමේන්තු අනුව 1961 දී හා 1960 දී පෞද්ගලික අංශයේ දළ ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය පහළ වැටීමට (කලින් සඳහන් කළ) ප්‍රධාන හේතු වී ඇත්තේ ‘පරිවහණය’ හා (වෙන තැනක නොසඳහන්) ආනයන කළ ප්‍රාග්ධන භාණ්ඩ යන වර්ගයන්හි පහළ වැටීම් බව පැහැදිලිව පෙනේ. මේවායින් ‘පරිවහණය’ වර්ගයෙහි පහළ වැටීම ඉතා තියුණු විය. බඩු තොග ප්‍රමාණයන්හි වෙනස්වීම ගැන සලකන විට, (තේ රබර් හා පශු සම්පත පමණක් සැලකිල්ලට ගෙන) 1960 බඩු තොග අඩු වූ බවද, 1959 හා 1961 බඩු තොග වැඩි වූ බවද පෙනී යයි.

**දළ දේශීය නිෂ්පාදිතයේ කාර්මික සැකැසුම**

පවත්නා සාධක මිල අනුව, දළ දේශීය නිෂ්පාදිතයෙහි කාර්මික සැකැසුම පිළිබඳ 1959 හා 1960 සංශෝධිත ඇස්තමේන්තු හා 1961 තාවකාලික ඇස්තමේන්තු ද 11-12 වැනි සටහනේ දක්වා ඇත.

සංඛ්‍යා සටහන II—12

**දළ දේශීය නිෂ්පාදිතයෙහි කාර්මික සැකසුම පවත්නා සාධක වියදම් මිල අනුව**

| කර්මාන්තය | 1959 | | 1960 | | 1961 | | ප්‍රතිශත වෙනස | |
|---|---|---|---|---|---|---|---|---|
| | රු.පි. දශ ලක්ෂ | ප්‍රති ශතය | රු.පි. දශ ලක්ෂ | ප්‍රති ශතය | රු.පි දශ ලක්ෂ | ප්‍රති ශතය | 1959 න් 1960 ට | 1960 න් 1961 ට |
| 1 කෘෂිකර්මය, දුව ඇ වන ද්‍රව්‍ය පශුසම්පත හා ධීවර කර්මාන්තය* .. | 2,475 | 42·1 | 2,623 | 42·6 | 2,616 | 41·4 | +6·2 | —0·5 |
| 2 පතල් හා ගල් කැණීමේ කර්මාන්තය .. | 12 | 0·2 | 13 | 0·2 | 13 | 0·2 | +9·0 | —3·8 |
| 3 නිෂ්පාදනය (ගොඩනැගිලි ද්‍රව්‍ය අත්හැර) .. | 325 | 5·5 | 356 | 5·8 | 376 | 6·0 | +9·8 | +5·6 |
| 4 ගොඩනැංවීම (ගොඩ නැගිලි ද්‍රව්‍ය ඇතුළු) .. | 532 | 9·0 | 508 | 8·2 | 609 | 9·6 | —4·4 | +19·8 |
| 5 ප්‍රවහනය, ගබඩා කිරීම, සහ පණිවුඩ .. | 548 | 9·3 | 576 | 9·3 | 587 | 9·3 | +5·2 | +1·9 |
| 6 තොග හා සිල්ලර වෙළෙඳාම .. | 702 | 11.9 | 730 | 11.8 | 698 | 11.1 | +4.1 | —4.5 |
| 7 නිවාස අයිතිය .. | 141 | 2·4 | 154 | 2·5 | 167 | 2·6 | +7·5 | +8·4 |
| 8 රාජ්‍ය පාලනය හා ආරක්ෂාව .. | 368 | 6·3 | 384 | 6·2 | 418 | 6·6 | +4·3 | +8·9 |
| 9 සේවා (වෙනත් තැනක ඇතුළත් නොවූ) | | | | | | | | |
| (අ) රජයේ වෛද්‍ය, සෞඛ්‍ය, අධ්‍යයන, ගුවන් විදුලි ප්‍රචාරය, ආකාශ වස්තු පරීක්ෂණ සේවා .. | 340 | 5·8 | 378 | 6·1 | 380 | 6·0 | +11·1 | +0·6 |
| (ආ) අනෙකුත් සියලු සේවා | 437 | 7·4 | 443 | 7·2 | 450 | 7·1 | + 1·4 | +1·6 |
| එකතුව .. | 777 | 13·2 | 821 | 13·3 | 830 | 13·1 | +5·6 | +1·2 |
| දළ දේශීය නිෂ්පාදිතය .. | 5,881 | 100·0 | 6,171 | 100·0 | 6,314 | 100·0 | +4·9 | +2·3 |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

* කෘෂිකාර්මික අපනයන පිළියෙළ කිරීමද ඇතුළත්ය.

සංඛ්‍යා සටහන II - 13

## නෑ. වි ස. අපනයන වටිනාකම්

රුපියල් දශ ලක්ෂ

| | පවත්නා මිල | | | | | 1956 ස්ථාවර මිල | | | | | 1959 ස්ථාවර මිල | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1959 | 1960 | 1961 | ප්‍රතිශත වෙනස 1959 න් 1960 ට | ප්‍රතිශත වෙනස 1960 න් 1961 ට | 1959 | 1960 | 1961 | ප්‍රතිශත වෙනස 1959 න් 1960 ට | ප්‍රතිශත වෙනස 1960 න් 1961 ට | 1959 | 1960 | 1961 | ප්‍රතිශත වෙනස 1959 න් 1960 ට | ප්‍රතිශත වෙනස 1960 න් 1961 ට |
| **දේශීය අපනයන:-** | | | | | | | | | | | | | | | |
| තේ .. .. | 1,045 | 1,096 | 1,114 | + 4·9 | + 1·7 | 1,151 | 1,229 | 1,277 | + 6·9 | + 3·9 | 1,045 | 1,115 | 1,158 | + 6·7 | + 3·9 |
| රබර් .. .. | 298 | 378 | 260 | +27·1 | —31·3 | 310 | 351 | 238 | +13·2 | —15·2 | 298 | 337 | 286 | +13·2 | —15·2 |
| පොල් සහ පොල් නිෂ්පාදිත | 285 | 238 | 247 | —16·5 | + 2·7 | 202 | 190 | 254 | — 5·6 | +33·3 | 285 | 270 | 359 | — 5·6 | +33·2 |
| අනෙකුත් .. | 64 | 62 | 59 | —33·5 | — 5·1 | 67 | 59 | 62 | —11·8 | + 4·4 | 64 | 56 | 59 | —11·7 | + 4·4 |
| එකතුව .. .. | 1,692 | 1,775 | 1,681 | + 4·9 | — 5·3 | 1,729 | 1,830 | 1,890 | + 5·8 | + 3·3 | 1,692 | 1,778 | 1,862 | + 5·1 | + 4·7 |
| **ප්‍රතිඅපනයන:-** එකතුව .. .. | 62 | 57 | 52 | — 7·9 | — 7·9 | 63 | 60 | 61 | — 4·8 | + 1·5 | 62 | 59 | 60 | — 4·7 | + 1·4 |

සංඛ්‍යා - ලංකා රේගු වාර්තා වලින් සහ ශ්‍රී ලංකා මහ බැංකුවෙනි

මෙම සටහනෙහි දැක්වෙන පරිදි, 1959 සිට 1961 දක්වා වූ තුන් අවුරුදු කාලයේ නිෂ්පාදන පිළිවෙළ පරීක්ෂා කිරීමේ දී, ආර්ථික සැකැස්මෙහි වැදගත් වෙනස් වීම් සිදු වූ බවට සාක්ෂි ඇත්තේ නොවේ. දක්නට ලැබෙන සුළු වෙනස්වීම් අනුව පෙනී යන්නේ 1959 සහ 1960 දී ඇති වූ වෙනස්කම් 1961 දී නැවත ආපස්සට පැමිණෙන සුළු බවකි. 1959 න් 1960 ට වූ වෙනස්වීම් 1960 න් 1961 ට වූ වෙනස්වීම් සමග සසඳා බලන විට 1961 දී (ගොඩනැගිලි කර්මාන්තයෙහි ගොඩනැගිලි උපකරණ නිෂ්පාදනය කරන කර්මාන්ත ඇතුළුව) සැලකිය යුතු දියුණුවක් සටහන් වී තිබේ. 1960 සමග සසඳනවිට, 1961 දී නිපැයුම පහළ වැටී ඇත්තේ තොග හා සිල්ලර වෙළෙඳම, පතල්, ගල් කැණීම, හා කෘෂිකර්මාන්තය, හා ධීවර කර්මාන්තය ආදිය ඇතුළත් ගණයෙහි පමණෙකි.

**නිෂ්පාදනය හා අපනයන**

අපනයන වටිනාකම්හි ඇති වන වෙනස්වීම්, පවත්නා මිල අනුව ද. 1956 ස්ථාවර මිල හා 1959 ස්ථාවර මිල අනුව ද, සකසා 11–13 වැනි සංඛ්‍යා සටහණෙහි දක්වා ඇත. 1961 දී තේ මිල මඳක් පහළ වැටුන ද, තේ අපනයන වටිනාකමෙහි වැඩි-වීමෙක් දක්වෙයි. පවත්නා මිලට වඩා (1956 සහ 1959) ස්ථාවර මිල අනුව බැලීමේ දී මේ වටිනාකමෙහි වැඩි වීම ද 1956 හා 1959 ට වඩා ඉහළ වෙයි. මෙය 1959 න් 1960 ට ඇති වූ සියයට 7 කට මදක් පහළ වැටීම හා සසඳන විට 1960 න් 1961 ට වූ වැඩිවීම සියයට 4 කට මඳක් අඩුය. පවත්නා මිල අනුව රබර් අපනයන වටිනාකම සියයට 31 කින් පහළ වැටුණ ද, ස්ථාවර මිල අනුව එක්කමෙහි පහළ වැටීම සියයට 15 ක් පමණ විය. පොල් නිෂ්පාදනය බොහෝ සෙයින් වැඩිවීම නිසා පොල් අපනයන මිලෙහි තියුණු පහළ වැටීමෙක් ද මැකී ගියේය.

වී නිෂ්පාදන හා මෙරට පාරිභෝජනය සඳහා නිෂ්පාදිත අනෙකුත් භාණ්ඩ ඇස්තමේන්තු පවත්නා නිෂ්පාදක මිල අනුව අගය කොට 11–14 වැනි සටහනෙහි දක්වා ඇත.

## සංඛ්‍යා සටහන II—14

# පවත්නා නිෂ්පාදක මිල අනුව දේශීය පාරිභෝජනය සඳහා මෙරට නිපදවන ලද භාණ්ඩ

රුපියල් දශලක්ෂ

| | 1959 | 1960 | 1961 | ප්‍රතිශත වෙනස 1959 න් 1960 ට | ප්‍රතිශත වෙනස 1960 න් 1961 ට |
|---|---|---|---|---|---|
| (1) කෘෂිකර්මය දුව ඈ වන ද්‍රව්‍ය, පශු සම්පත හා ධීවර කර්මාන්තය .. | | | | | |
| හාල් .. | 379 | 469 | 483 | + 23·8 | + 3·0 |
| පොල් හා පොල් නිෂ්පාදිත | 169 | 151 | 132 | — 10·8 | — 12·2 |
| තේ .. | 51 | 53 | 53 | + 4·3 | ... |
| අනෙකුත් ආහාර බෝග | 327 | 354 | 386 | + 8·4 | + 9·0 |
| දුම්කොල .. | 15 | 14 | 15 | — 6·7 | + 7·1 |
| බුලත් සහ පුවක් .. | 34 | 37 | 38 | + 7·6 | + 1·4 |
| දර .. | 12 | 14 | 15 | + 13·8 | + 4·3 |
| පශු සම්පත .. | 137 | 135 | 136 | — 1·0 | + 0·6 |
| මාළු .. | 60 | 69 | 77 | + 13·9 | + 11·9 |
| විවිධ .. | 47 | 51 | 53 | + 9·4 | + 3·1 |
| පාවිච්චි කළ ආනයන භාණ්ඩ අඩුකොට .. | — 19 | — 20 | — 19 | + 2·6 | — 3·0 |
| දේශීය නිෂ්පාදනයෙන් එකතුකළ වටිනාකම .. | 1,211 | 1,327 | 1,368 | + 9·6 | + 3·1 |
| (2) කර්මාන්ත (ප්‍රාග්ධන සංවර්ධනය අත්හැර) .. | | | | | |
| කර්මාන්ත ශාලා මගින් කෙරෙන කර්මාන්ත .. | 315 | 383 | 409 | + 21·5 | + 6·7 |
| ගෘහ කර්මාන්ත .. | 99 | 101 | 104 | + 1·5 | + 3·1 |
| පාවිච්චි කළ ආනයන භාණ්ඩ අඩුකොට .. | — 93 | — 129 | — 138 | + 39·1 | + 6·4 |
| දේශීය නිෂ්පාදනයේදී එකතුකළ වටිනාකම .. | 321 | 354 | 375 | + 10·2 | + 5·8 |

සංඛ්‍යා:- ශ්‍රී ලංකා මහ බැංකුව, ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව හා ධීවර කර්මාන්ත දෙපාර්තමේන්තුව ආදියෙනි.

1960 දීට වඩා 1961 දී කෘෂිකාර්මාන්ත අංශයෙහි නිෂ්පාදනය සුළු වශයෙන් ඉහළ ගියේ 1961 සහල් නිෂ්පාදනය මඳක් වැඩිවීමෙන් බව මෙම සංඛ්‍යා සටහනෙහි එන සවිස්තර ඇස්තමේන්තු වලින් පැහැදිලි වෙයි. කාර්මික නිෂ්පාදන අංශයෙහි (ගොඩනැගිලි කර්මාන්ත හා ගොඩනැගිලි භාණ්ඩ නිෂ්පාදන කර්මාන්ත හැර) 1961 දීවූ නිෂ්පාදනයෙහි වැඩිවීම සියයට 5·8 ක් යැයි තාවකාලික වශයෙන් ඇස්තමේන්තු කොට ඇති අතර, 1960 දීවූ වැඩිවීම සියයට 10·2 ක් වෙයි. 1960 හා සසඳන විට 1961 වැඩිවීමේ ප්‍රමාණය පහළ වැටී ඇත්තේ කර්මාන්තශාලීය කර්මාන්ත සම්බන්ධයෙන් 1961 සඳහා ලැබී ඇති සංඛ්‍යා වලින් ඌනු වර්ධනයක් පෙන්නුම් කරන නිසාය. එහෙත් මෙම සංඛ්‍යාවල පූර්ණත්වය තරමක් සැකයට ලක් වූයේ වෙයි. ගෘහ කර්මාන්ත නිෂ්පාදනයන් පිළිබඳව සටහනෙහි දක්වා ඇති සංඛ්‍යාවන්හි නිවැරදිකම ද සැක සහිතය. ඊට හේතුව ඒවා සැකයට භාජන විය හැකි උපකල්පනයන් මත පිහිටා සැපයූ අනියම් ඇස්තමේන්තු වීමය.

ප්‍රධාන අපනයන භාණ්ඩ හා වී වගාව පිළිබඳ තොරතුරු සවිස්තරව පහත දැක්වේ.

## තේ

1960 අවසානයේ දී තේ වගා කොට තිබූ බිම් ප්‍රමාණය අක්කර 531821 ක්වූ අතර, 1961 අවසානයේ දී එය අක්කර 584551 ක් විය. 1961 දී නිෂ්පාදනය කළ මුළු තේ ප්‍රමාණය රාත්තල් කෝටි 45·5 ක් යැයි ඇස්තමේන්තු කොට ඇත. 1960 දී නිෂ්පාදනය තේ රාත්තල් කෝටි 43·5 ක් විය. මෙසේ තේ නිෂ්පාදනය 1961 දී රාත්තල් කෝටි 2·0 කින් වැඩි වූ අතර, එය 1960 දී වැඩිවීමේ ප්‍රමාණය සියයට 4·6 ක් විය. මෙය පසුගිය දසකය තුළ වැඩිවීමේ ප්‍රමාණය වන සියයට 3·8 හා මැනවින් සැසැඳේ. 1961 වැඩි වූ තේ නිෂ්පාදනයෙන් වැඩි කොටසක්ම ලැබුනේ මැදිබිම් වගාවෙනි. 1960 දී තේ රාත්තල් කෝටි 15·3 ක් සැපයූ මැදිබිම් වගාව 1961 දී තේ රාත්තල් කෝටි 16·3 ක් සපයා ඇත.

1961 දී අක්කරයකින් ලැබුණ තේ ප්‍රමාණය රාත්තල් 778 ක් විය. 1960 දී හා 1959 දී ලැබුණ ප්‍රමාණයන් පිළිවෙළින් රාත්තල් 748 ක් හා රාත්තල් 714 ක් විය. තේ නැවත වගා කිරීමේ ක්‍රමය යටතේ කැරුන වගාව හෙමින් පැවැතියද 1961 දී තේ නිෂ්පාදනය (අක්කරයකින්) වැඩි වූ බව සැලකිය යුතුය. පළදාව අධික තේ නැවත වගා කිරීම දස අවුරුදු සැලැස්මේ ප්‍රධාන නිර්දේශයක් විය. 1968 අවසාන වන විට අක්කර 50,000 ක් නැවත වගා කිරීම එහි බලාපොරොත්තුව වුවද, 1961 දී නැවත වගා කළ බිම් ප්‍රමාණය අක්කර 1298 ක් පමණෙකි.

1961 පිටරට පැට වූ මුළු තේ ප්‍රමාණය කෝටි 42·6 කි. මෙය 1960 පැට වූ රාත්තල් කෝටි 41·0 ප්‍රමාණයට වඩා සියයට 4 කින් වැඩිය. එහෙත් සාමාන්‍ය මිල 1960 මට්ටමට වඩා සියයට 2 කින් අඩු වූ බැවින් තේ අපනයනයෙහි මුළු වටිනාකම වැඩි වූයේ සියයට 2 කින් පමණෙකි.

## රබර්

1960 දී රබර් වගා කොට තිබූ බිම් ප්‍රමාණය අක්කර 668123 ක් විය. 1961 දී මෙය අක්කර 6,69,013 දක්වා වැඩි විය. 1961 අවසානය වනවිට අක්කර 1,69,727 නැවත වගා කොට තිබිණි. මෙසින් අක්කර 9,742 ක් වගා කැරුනේ 1961 දීය. 1953 දී ආරම්භ කැරුන රබර් නැවත වගා කිරීමේ ආධාර ක්‍රමය යටතේ, එවකට ඵලදායී නොවන රබර් අක්කර 2,00,000 ක් 1962 අවසාන වන විට වගා කිරීමට බලාපොරොත්තු විය. මේ ඉලක්කය සඳහා 1962 වර්ෂය තුළ රබර් අක්කර 30,000 ක් පමණ නැවත වගා කළ යුතුව තිබිණි.

1960 දී රබර් නිෂ්පාදනය රාත්තල් කෝටි 21·8 ක්වූ අතර, 1961 දී මෙය රාත්තල් කෝටි 21.5 ක් දක්වා පහළ වැටී ඇත. කිරි කැපීම සඳහා රබර් ගසක් වයස අවුරුදු 7 ක් පමණ විය යුතුය. එබැවින් අවුරුදු 7 කට පෙර එනම් 1954 දී

නැවත වගාකළ හා, අළුතින් වගාකළ බිම් ප්‍රමාණය සලකා බැලීම වේ. 1954 දී ප්‍රධාන වශයෙන්ම කිරි වැඩි රබර් වර්ග වලින් අක්කර 18301ක් වගා කැරිණි. මෙයට අමතරව අළුතින් අක්කර 1879 ක රබර් සිටුවා ඇත. මෙම අක්කර 20180 කිරි කැපීම 1961 දී ආරම්භ වන්නට ඇත. අතිරේකව මෙසේ කිරි වැඩි රබර් වගාවක් තිබුණ ද, 1961 දී නිෂ්පාදනය රාත්තල් කෝටි 0·3 කින් පමණ පහළ වැටී තිබිණි. නැවත වගා කිරීමේ කටයුතු නිසා තාවකාලික වශයෙන් නිෂ්පාදනය නැවතුන බිම් ප්‍රමාණය ද තවම කිරි කැපීමට තරම් නොමේරූ රබර් ගස් ඇති බිම් ප්‍රමාණය ද මෙයට සාධක වූ කරුණු වශයෙන් දැක්විය හැකිය. 1961 අවසාන භාගයේ දී පැවති තද වර්ෂාපතනය ද කිරි කැපීමට බාධා ඇති කළා විය හැකිය. එසේම රබර් මිල අඩුවීම ද නිෂ්පාදනය අඩු-වීමට හේතු වන්නට ඇත.

1959 දී රබර් අක්කරයක සාමාන්‍ය නිෂ්පාදනය (මුළු රබර් වගාවෙන් සියයට 20 ක් පමණ තවම කිරි නොකපන සේ අත්හැර) රාත්තල් 408 ක්වූ අතර, 1961 දී එය රාත්තල් 400 ට පමණ පහළ වැටිණි.

1961 දී පිටරට පැටවූ රබර් ප්‍රමාණය රාත්තල් කෝටි 19·7 ක් විය. 1960 දී පැටවූ ප්‍රමාණය රාත්තල් කෝටි 23·5කි. රබර් පිටරට පැටවීමෙන් ලැබුණ ආදායම සියයට 31 කින් පමණ පහළ වැටිණි. මෙයට හේතු වූයේ පරිමාව සියයට 16 කින් පමණද මිල සියයට 18 කින් ද පහළ වැටීමය.

**පොල්**

1961 පොල් නිෂ්පාදනය ගෙඩි කෝටි 259·6 ක් යැයි ඇස්තමේන්තු කොට ඇත. 1960 නිෂ්පාදන ගෙඩි 222·0 ක් විය. ඇස්තමේන්තු වලට මෙරට පාරිභෝජ-නයට ගත් ගෙඩි ගණනත් (ගෙඩි කෝටි 124·1 ක් යැයි ඇස්තමේන්තු කොට ඇති) පිටරට පැට වූ ගෙඩි ගණනත් (ගෙඩි කෝටි 135·5) ඇතුළත් විය. තොග වෙනස්වීම් පිළිබඳ සංඛ්‍යා තොරතුරු නොමැති බැවින් නිෂ්පාදනයබොහෝ දුරටම නිගමනය කැරෙනුයේ පිටරට යැවෙන ප්‍රමාණයන්හි ඇතිවන වෙනස්වීම් අනුවය.

1960 දීට වඩා 1961 දී පොල් නිෂ්පාදිතය ගෙඩි කෝටි 37·6 කින් වැඩිවීමට ප්‍රධාන හේතුන් වූයේ යහපත් කාලගුණයත් මෑත වර්ෂවල දී පෝර වැඩියෙන් යෙදීමත්ය.

ගෙඩි ගණන අනුව බලන කල තෙවැදෑරුම් ප්‍රධාන පොල් නිෂ්පාදිතයන්ගේ මුළු අපනයන පරිමාව සියයට 39 කින් වැඩි වී ඇත.* එහෙත් මෙයින් ලැබුණ ආදායම රුපියල් කෝටි 20·2) 1960 දීට වඩා වැඩි වූයේ සියයට 10 කින් පමණකි. මෙයට හේතු වූයේ ප්‍රධාන පොල් නිෂ්පාදිත තුනෙහි අපනයන මිල දර්ශකයෙන් දැක්වෙන) පරිදි) මිල සියයට 22 කින් පහළ වැටීමය.

**වී**

1961 වී නිෂ්පාදනය බුසල් කෝටි 4·32 ක් යැයි තාවකාලික වශයෙන් ඇස්ත-මේන්තු කොට ඇත. මෙය බුසල් කෝටි 4·31 ක්වූ 1960 නිෂ්පාදනයට (සංශෝධිත සංඛ්‍යාව) වඩා මඳක් වැඩිය. 1959–60 මහ මෝසමේ අස්වැන්න බුසල් කෝටි 2·63 ක්වූ අතර 1960–61 දී එය බුසල් කෝටි 2·71 දක්වා ඉහළ ගියේය. යල් මෝසමේ අස්වැන්න 1960 දී බුසල් කෝටි 1·68 ක් වූයේ 1961 දී බුසල් කෝටි 1·61 ට අඩුවිය. 1960–61 මහ මෝසමේ දී (ශුද්ධ) අක්කරයකින් ලැබුණ අස්වැන්න ප්‍රමාණයේ සාමාන්‍යය බුසල් කෝටි 35·9 ක් විය. මෙය බුසල් 36·1 ක්වූ 1959–60 අස්වැන්න සාමාන්‍යයට මඳක් අඩුය. යල් මෝසමේ සාමාන්‍ය අස්වැන්න ද මඳක් පහළ වැටිණි. තාවකාලික ඇස්තමේන්තු අනුව 1960 දී අක්කරයට බුසල් 36·8 ක්වූ මෙය 1961 දී බුසල් 36·5 දක්වා පහළ වැටී ඇත.

1961 දී සහතික මිල ක්‍රමය යටතේ මිලට ගත් මුළු වී ප්‍රමාණය බුසල් කෝටි 2·26 ක් විය· 1960 දී මිලට ගත් ප්‍රමාණය බුසල් කෝටි 2·18 කි.

1961 දී නිෂ්පාදනය සහල් වලින් ටොන් 562800 ක්වූ අතර 1960 වූ නිෂ්පාදනය සහල් ටොන් 561400 කි, මෙරට පාරිභෝජනය සඳහා සහල් ටොන් 1056400ක් අවශ්‍ය යැයි ඇස්තමේන්තු කොට ඇත. 1961 දී මෙරටට ගෙන්වූ සහල් ප්‍රමාණය ටොන් 461600 කි.

---

* තෙවැදෑරුම් පොල් නිෂ්පාදිත පිළිබඳ මහ බැංකු පරිමා දර්ශකයට අනුව වැඩිවීම මඳක් වැඩි බව (සියයට 41) පෙනී යයි·

## ජාතික නිෂ්පාදිතය හා වියදම් විග්‍රහව

26 වැනි පිටුවේ අධොලිපියේ සඳහන් කර ඇති පරිදි, මෙම වාර්තාවෙන්ද පළ කැරෙන, ජාතික නිෂ්පාදනය හා වියදම් ඇස්තමේන්තු, කලින් සංඛ්‍යා හා ජනලේඛන දෙපාර්තමේන්තුවෙන් පළ කැරුන, ඇස්තමේන්තු වලට (සහ මහ බැංකුව විසින් මින් පෙර වාර්ෂික වාර්තාවන්හි පළ කළ) වෙනස් වෙයි. මෙයට හේතුව වනුයේ මෙතෙක් ලංකාවේ ඇස්තමේන්තු සකස් කරලීම සඳහා භාවිතා කැරුන ක්‍රමයන්ට මඳක් වෙනස්වූ ක්‍රමයන් අනුව මෙහි ඇස්තමේන්තු සකස් කිරීමයි.

මෙතෙක් භාවිතා කරනු ලදුයේ, 1952 පළ කරන ලද ජාතික ආදායම පිළිබඳ තම වාර්තාවේ කේ. විලියම්ස් මහතා විසින් භාවිතාකරනලද ක්‍රමයයි. මෙම ක්‍රමය ඊට කලින් පැවති ක්‍රමයන්ට වඩා දියුණු එකක් වූවද, එහි දූර්වල තැන් කීපයෙක් විය. වර්තමාන ඇස්තමේන්තු වල කර ඇති වෙනස්කම් වලින් මෙම දූර්වලතා මගහරවා ලීම අදහස් කැරේ. ඇස්තමේන්තු පිළිබඳ න්‍යායානුකූල පදනම දියුණු කිරීමෙනුත් ආර්ථික-කටයුතු සඳහා වඩා පුළුල් ආවරණ පථයක් ඇති කරලීමෙනුත් නිෂ්පාදන හා වියදම් ශීර්ෂයන් සවිස්තරව සලකා බැලීමේදී, ඒවායේ පරස්පර විරෝධීතා ඇති නොවීමට වග බලා ගැනීමෙනුත් මෙම දුෂ්කරතා මගහරවා ලීමට බලාපොරොත්තු වනු ලැබේ. එසේ වූවද, මෙම ඇස්තමේන්තු වල සීමිතකම් නැත්තේ නොවේ. එහෙත් ඒවාට හේතුවී ඇත්තේ. ලංකාවේ ආර්ථික කටයුතු පිළිබඳ යම් යම් සංඛ්‍යා තොරතුරු ප්‍රමාණවත්ව ලබා ගැනීමට නොහැකි වීමය. කෙසේ වූවද අනාගතයේදී සංඛ්‍යා තොරතුරු වල විෂයපථයන්, හා තත්ත්වයන් දියුණු වනු ඇතැයි බලාපොරොත්තු විය හැකිය. එවිට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පිළියෙල කරනු ලබන ජාතික නිෂ්පාදන හා වියදම් ඇස්තමේන්තුව තව දුරටත් හොඳින් පිළියෙළ කිරීමට හැකිවනු ඇත.

### ඇස්තමේන්තු කිරීමේ ක්‍රමයන්හි ප්‍රධාන වෙනස්කම්

වර්තමාන ඇස්තමේන්තුවල ඇති කර තිබෙන වඩා වැදගත් වෙනස්කම් පහත විස්තර කැරේ.

### අපනයන සඳහා නිෂ්පාදනය – 11 – 2 සටහනෙහි (1) ශීර්ෂය.

මෙතෙක් අපනයනය සඳහා ශුද්ධ නිෂ්පාදන ප්‍රමාණය ගණන් බලන ලද්දේ අපනයනයන්ගේ නෑ. වි. ස. වටිනාකමින්, පාවිච්චි කරනු ලැබූ ආනයන ද්‍රව්‍යවල වටිනාකම අඩු කිරීමෙනි. මේ පිළිබඳව වර්තමාන ඇස්තමේන්තු වල තුන්ආකාර දියුණුවක් දක්වේ.

පළමුව, තොග වෙනස්වීම්හි වටිනාකම සඳහා, එම වෙනස්වීම් ගැන දැනගත හැකි ප්‍රමාණයට ගැලපීම් ඇතුළත් කොට ඇත. තේ සහ රබර් තොග වල වෙනස්කම් නිෂ්පාදන හා අපනයන සංඛ්‍යා අනුව සොයා ගත හැකිය. එබැවින් මේ සංඛ්‍යා සැලකිල්ලට ගෙන තිබේ. එහෙත් පොල් නිෂ්පාදිත පිළිබඳව තත්ත්වය මෙසේ නොවේ. මෑත අවුරුදු වලදී තේ හා රබර් තොග වෙනස් වීම්හි වටිනාකම විශාල බැවින්, ඒවා ගණන් නොගැනීම බරපතල අත් හැරීමෙකි.

දෙවනුව, වර්තමාන ඇස්තමේන්තු වල අපනයන නිෂ්පාදිතයන් සඳහා උපයෝගී කර ගන්නා ආනයන භාණ්ඩ පිළිබඳ ආවරණ පථය පුළුල් කොට ඇත. අපනයන කළ, තෙල් වර්තමාන ඇස්තමේන්තු වලට ඇතුළත් වෙයි. මෙම තෙල් වතු වල කර්මාන්තශාලාවන් සඳහාත්, අපනයන භාණ්ඩ ප්‍රවහණය සඳහාත් පාවිච්චි කැරේ. මින් පෙර, අපනයන අංශයෙහි, ආනයන කළ තෙල් ද්‍රව්‍ය සඳහා අඩු කිරීමක් නොතිබීමෙන් අපනයන නිෂ්පාදනය එක්තරා ප්‍රමාණයකට අධිකව ඇස්තමේන්තු වී තිබෙන්නට ඇත.

තෙවනුව, වර්තමාන ඇස්තමේන්තු වල, ප්‍රති-අපනයන් වෙළෙඳම මගින් එකතු කළ වටිනාකම් සැලකිල්ලට ගෙන ඇත. සාමාන්‍යයෙන් කුඩා ශීර්ෂයක් වූවද මෙය ඇතුළත් කිරීම න්‍යායානුකූලව අවශ්‍යය.

**නිවාස අයිතිය - 11 - 2 සටහනෙහි 11 (iv) ශීර්ෂය.**

කලින් නොසලකා හැර තිබූ ගම්බද ගෙවල් කුළී සඳහාද ඇස්තමේන්තුවක් සකස් කිරීමෙන් පදිංචි නිවාස සඳහා කුළී යන ශීර්ෂය තවදුරටත් පුළුල් කොට තිබේ. නිවාස වල කුළිය, සියළුම ගොඩනැගිලි වල කුළීමෙන් සියයට 75 ක් වේයයි සලකනු ලැබේ.

**වෙළෙඳ මිල අනුව, මෙරට නිපදවන භාණ්ඩ හා සේවා 11 - 10 සටහනෙහි ආ (I) ශීර්ෂය.**

වර්තමාන ඇස්තමේන්තුවල පෞද්ගලික පාරිභෝජනය සඳහා මෙරට නිපදවනු ලැබූ භාණ්ඩ වල වටිනාකම ගණන් ගනුයේ, එම භාණ්ඩ සිල්ලර මිලට වෙළෙඳාම් වූ ප්‍රමාණය අනුවය. කලින් ඇස්තමේන්තු වල, මෙරට නිපදවන භාණ්ඩ සියයට 50 ක් වෙළෙඳාම් වූ ලෙසත්, ඉතිරි සියයට පණගහ නඩත්තු නිෂ්පාදන ලෙසත් සලකනු ලැබීය. වර්තමාන ඇස්තමේන්තු වල, මෙසේ සැලකීම අත්හැර තිබේ. ඒ වෙනුවට, එක් එක් වර්ගයෙන් වෙළෙඳාම්වූ ප්‍රමාණය සවිස්තරව ප්‍රතිකල්පනය කොට, මෙරට නිෂ්පාදිත භාණ්ඩ වල වෙළෙඳ වටිනාකම පියවරින් පියවර ගණන් බලා තිබේ. (සලාකයට බාහිරව වෙළෙඳාම් වූ සහල් ප්‍රමාණය සියයට 40 ක් ද, වෙළෙඳාම් වූ පොල් නිෂ්පාදිත සියයට 60 ක්ද, අනෙකුත් ආහාර භෝග සියයට 50 ක්ද, බුලත් හා පුවක් සියයට 80 ක්ද, දර සියයට 30 ක්ද, පශු සම්පත් ද්‍රව්‍ය සියයට 80 ක්ද, මාලු සියයට 95 ක්ද, විවිධ කෘෂිකර්ම හා වන ද්‍රව්‍ය සියයට 50 ක්ද තේ, දුම්කොළ හා කාර්මික නිෂ්පාදිත සියයට 100 ක්ද ලෙස සලකා ඇත. වෙළෙඳාම් නොවූ නඩත්තු නිෂ්පාදිතයන්හි වටිනාකම, එක්සත් ජාතීන්ගේ, සංඛ්‍යා ලේඛන කාර්යාලයේ නිර්දේශ අනුව නිෂ්පාදකයාගේ මිල අනුව ගණන් ගෙන ඇත. එහෙත් මේ ක්‍රමය සුදුසුතම ක්‍රමය ද යන්න විවාදයට ඇරුනකි. *

නිෂ්පාදකයන් මේ අවශ්‍ය භාණ්ඩ තමන් විසින්ම නිපදවා නොගන්නේ නම් එම භාණ්ඩ ඔවුන් විසින් වෙළෙඳ පොළෙන් ගත් මිල, අගය කිරීමෙන් පිළිබිඹු විය යුතුය යන තර්කය උඩ යැපුම් නිෂ්පාදනයන්ද සිල්ලර මිලට අගය කළ යුතුය යන අනෙක් අදහසට පක්ෂව කරුණු දැක්විය හැකිය. මේ අදහසේ යෝග්‍යතාවය කෙසේ වුවද, සිල්ලර මිල අනුව අගය කිරීම තීරණය කරන්නේ නම් එය නිෂ්පාදනයට ඉතා–මත් කිට්ටු වෙළෙඳ පොලේ පවත්නා සිල්ලර මිල අනුව විය යුතුය. මේ ඇස්තමේන්තු වල නිෂ්පාදකයාගේ මිල අනුව අගය කොට දක්වා තිබෙන්නේ දැනට මෙරට නිෂ්පාදිත භාණ්ඩවල සිල්ලර මිල පිළිබඳ සංඛ්‍යා තොරතුරු සපයා ඇත්තේ ගම්බද වෙළෙඳ පොලේ පවත්නා සිල්ලර මිල පදනම් කොට ගෙන නොව නාගරබද වෙළෙඳ පොලේ සිල්ලර මිල පදනම් කොට ගෙන ඇති බැවිනි.

**මෙරට සංචාරය 11 - 10 සටහනෙහි ආ (iii) ශීර්ෂය.**

මින් පෙර, දුම්රිය, බස්රථ, ට්‍රොලි හා ට්‍රෑම් රථ වල මගීන්ගේ ගමනා–ගමනය පමණක් සැලකිල්ලට ගනු ලැබීය. මීට ඇතුළත් විය යුතු කරුණු සම්පූර්ණ වීම සඳහා වර්තමාන ඇස්තමේන්තුවල අනෙකුත් වර්ගවල, එනම්, කුලී රථ, පෞද්ගලික මෝටර් රථ, මෝටර් සයිකල් යනාදියෙන් මගීන්ගේ ගමනාගමනයද ඇතුළත් කරන ලදී.

**වෙළෙඳාම (රජයේ නොවන, අපනයන නොවන) 11 - 2 සටහනෙහි 11 (vi) ශීර්ෂය**

**පරිවහණය (රජයේ නොවන, අපනයන නොවන) 11 - 2 සටහනෙහි 11 (vii) ශීර්ෂය.**

වර්තමාන ඇස්තමේන්තු වල වැදගත් ප්‍රතිශෝධනය ඇති වූයේ වෙළෙඳාම් හා පරිවහණ (රජයේ නොවන, අපනයන නොවන) ශීර්ෂයන්හිය. වෙළෙඳාම හා පරිවහණය එකට ගත් කල, දේශීය පාවිච්චිය සඳහා මෙරට භාණ්ඩ බෙදාහැරීමේ පිරිවැය එහි කොටසක් වෙයි. වර්තමාන ඇස්තමේන්තුවල මේ කොටස ඇස්තමේන්තු කොට ඇත්තේ සලාක හාල් (1) අත්හැර මෙම භාණ්ඩවල වෙළෙඳ වටිනාකම (වියදම් අනුව ඇස්තමේන්තු කළ) සහ සමාන භාණ්ඩවල නිෂ්පාදකයාගේ වටිනාකම (නිෂ්පා දිත අනුව ඇස්තමේන්තු කළ) අතර මුළු වෙනස සැලකිල්ලට ගෙන එය පාරිභෝජන ආධාර වලින් අඩු කොටගත් අවක්‍ර බදු හා ගැලපීමෙනි.

---

(1) සලාක සහල් මෙහි ගණන් නොගෙන ඇත්තේ, සලාක සහල්වල වෙළෙඳ හා පරිවහණ වියදම් වෙනත් තැනක (රජයේ නිෂ්පාදන යටතේ) ඇතුළත් වන බැවිනි.

මින් පෙර ඇස්තමේන්තු සඳහා උපයෝගී කරගත් ක්‍රමය මීට අනුකූල වූවද එය යම් යම් ඉතාවැදගත් අංශයන්ගෙන් වර්තමාන ක්‍රමයට වඩා වෙනස් විය. පෙර ඇස්තමේන්තු වල දේශීය පාවිච්චිය සඳහා ගනු ලබන (සලාක සහල් ඇතුළු) මෙරට නිපදවන භාණ්ඩ සම්බන්ධයෙන් වෙළඳ වටිනාකම (වියදම් අනුව) හා නිෂ්පාදන වටිනාකම (නිෂ්පාදිත අනුව) අතර සැසඳීම වර්තමාන ක්‍රමයේදී මෙන්විය. මෙම මූළුවෙනස සියළු ආධාර අඩු කොටගත් අවක්‍ර බද්දවලට ගලපන ලදි. ඉන්පසුව මෙම ගැලපූ වෙනසින් වෙළඳම හා පරිවහණ සඳහා වෙන්කරන ලද්දේ සියයට පණහක් පමණකි. මෙසේ කරන ලද්දේ මෙරට නිපද වූ භාණ්ඩ අතුරෙන් වෙළඳම් වනුයේ සියයට 50 ක් පමණ බැව් සැළකූ බැවිනි. එම වෙනසින් ඉතිරි සියයට 5(ත් අත්හැර දමනු ලැබීය.

මෙම ක්‍රමයෙහි අසතුටුදායක අංගකිපයක් තිබේ. පළමුව මෙම භාණ්ඩ වල නිෂ්පාදකයාගේ වටිනාකමට නිෂ්පාදකයාගේ ආධාර ද ඇතුළත් වන බැවින් සිල්ලර වටිනාකම හා නිෂ්පාදන වටිනාකම අතර මූළු වෙනස ගැලපිය යුත්තේ සියළු ආධාර අඩු කොටගත් අවක්‍ර බදු අඩුකිරීමෙන් නොව පාරිභෝජන ආධාර අඩු කොටගත් සියළු බදු අඩුකිරීමෙනි. දෙවනුව, වියදම් අනුසාරය අනුව මෙරට-නිපදවන සියළුම භාණ්ඩවල වටිනාකම එම භාණ්ඩ වලින් (වෙළඳාම් වූ සියයට පණහක් සම්බන්ධයෙන් පමණක් වෙළඳ හා පරිවහණ ගාස්තු ගණන්ගෙන තිබියදී) සිල්ලර මිල අනුසාරය අනුව සැලකීම, වියදම් අනුසාරය හා නිෂ්පාදන අනුසාරය අතර නොගැලපීමක් ඇතිකරයි. මෙසේ නොවන්නට නම් වෙළඳම් නොවූ සියයට 50 ක භාණ්ඩ වල වෙළඳාම් හා පරිවහණ වියදම් වශයෙන් සැලකිය හැකි ප්‍රමාණය නිෂ්පාදන අනුසාරය අනුව නියම වෙළඳ හා පරිවහණ ශීර්ෂයට ඇතුළත් කළ යුතුයි.

නිෂ්පාදන අනුසාරයෙන් වූ ඇස්තමේන්තු, වියදම් අනුසාරයෙන් වූ ඇස්තමේන්තු වලට සම්පූර්ණයෙන්ම ස්වාධීන යයි සලකා මෙම අනුසාර දෙකින් ලබාගෙන ඇති ඇස්තමේන්තු ගැලපීමට උත්සාහ නොගන්නේ නම් මෙම නොගැලපීම නොතකා හරින්නට පුළුවන. නමුත් වියදම් ඇස්තමේන්තු, නිෂ්පාදන ඇස්තමේන්තු හා ගැලපීමට උත්සාහයක් දරා ඇති බැවින්, වෙළඳම් නොකළ ප්‍රමාණයෙහි සිල්ලර මිලෙහි හා නිෂ්පාදන මිලෙහි වෙනසට සමාන ආරෝපිත ප්‍රමාණයක් නිෂ්පාදන අංශයට එකතු කළ යුතුය. එසේ නොමැතිනම් මෙම ප්‍රමාණය සංඛ්‍යා විෂමතාවන්හි පිළිබිඹු වනු ඇත. මින් පෙර වියදම් හා නිෂ්පාදන ඇස්තමේන්තු ගැලපීමේදී මෙවැනි ආරෝපිත ප්‍රමාණයක් නොමැති වූවද සංඛ්‍යා විෂමතාව ඉතා සුළුවීම මෙම තර්කයට හානිකර-නොවේ. එයින් දක්වෙනුයේ සාමාන්‍යයෙන් පෙනීයන විෂමතාවට වඩා විශාල සංඛ්‍යා විෂමතාවක් වියදම් හා නිෂ්පාදන ඇස්තමේන්තු අතර තුබූ බවයි. සිදුවී ඇත්තේ මෙම විෂමතාව, නිෂ්පාදන අංශයෙහි නඩත්තු නිෂ්පාදනයට අදාළ ආරෝපිත-වෙළෙඳ හා පරිවහණ ශීර්ෂයක් (මෑත අවුරුදු වලදී රුපියල් කෝටි 15·0 ක් වූ) ගණන් නොගැනීමෙන් මැකී යාමය.

බෙද හැරීමේ වියදම්, (මෙරට නිපද වූ හා ගෙන් වූ භාණ්ඩ) වෙළඳමට සියයට 70 ක්ද පරිවහණයට සියයට 30 ක් වශයෙන්ද යෙදීමෙන් වර්තමාන ඇස්තමේන්තු වල පෙර පැවති ක්‍රමයම අනුගමනය කොට ඇත. එහෙත් වෙළඳමෙහි ශුද්ධ පිරිවැටුම ඇස්තමේන්තු කිරීම, පෙරට වඩා වෙනස්ය. වර්තමාන ඇස්තමේන්තු වල වෙළෙඳ ගොඩනැගිලි සඳහා වූ කුලී අඩු කොට නොමැත. නිවාස අයිතිය යටතේ වෙළෙඳ ගොඩනැගිලි කුලී ඇතුළත් නොවන බැවින් මෙහිදී ඒවා අඩු කිරීම න්‍යායානුකූලව වැරදිය. (ද්විත්ව ගණන් ගැනීමක් වූයේ නම් පමණක් එසේ අඩුකිරීම සුදුසු වන්නට පුළුවන.)

වර්තමාන පරිවහණ ඇස්තමේන්තු වලට, භාණ්ඩ පරිවහණයට අතිරේකව දුම්රිය, බස්රිය, ට්‍රොලි, ට්‍රෑම්, කුලී රථ පුද්ගලික මෝටර් රථ, මෝටර් සයිකල් ආදියෙන් මගීන්ගේ ගමනාගමනයද ඇතුළත් වෙයි. පරිවහණයෙහි ශුද්ධ පිරිවැටුම සකස් කරනුයේ ආනයන භාණ්ඩ ඉතා ප්‍රවේශමෙන් අඩු කිරීමෙනි.

### රජයේ ශුද්ධ පිරිවැටුම – මෙතෙක් ඇතුළත් නොකළ 11 – 2 සටහනෙහි II (viii) ශීර්ෂය.

සම්මත පිළිවෙළ අනුව රජයේ ශුද්ධ පිරිවැටුම සකස්කර ගනුයේ රජයේ සේවකයන්ට කරන ගෙවීම් වලිනි.* වර්තමාන ඇස්තමේන්තු මින්පෙර ඇස්තමේන්තුවලට වඩා පහත දක්වෙන කරුණුවලින් වෙනස් වෙයි.

(1) ගෙවල් කුලී පෞද්ගලික ගෙවීමක් ලෙස සලකා ඇති අතර, ගමන් දීමනා ඇතුළත් කර නොමැත.

(ii) රජයේ ගොඩනැගිලි කුලී වශයෙන් ආරෝපිත ප්‍රමාණයක් ඇතුළත් කර ඇත.

(iii) රජය විසින් විශ්‍රාම වැටුප් ඇතුළත් කොට ඇත. (එක්සත් ජාතීන්ගේ සංඛ්‍යා ලේඛන කාර්යාලය විසින් මෑත දී, විශ්‍රාම වැටුප් අරමුදල්වලට ගෙවන දායක දීමනා වෙනුවට නියම වශයෙන් ගෙවන ලද විශ්‍රාම වැටුප් රජයේ සේවකයින්ගේ වේතන හා වැටුප්වලින් කොටසක් ලෙස සලකා අනුමත කරන ලදී).

### පිටරටින් ලද ශුද්ධ ආදායම 11-2 සටහනේ iv ශීර්ෂය

මෙම ශීර්ෂයට අයත් වනුයේ පිටරටින් ලැබෙන අයෝජන ආදායමින් පිට රටට යැවිය යුතු ආයෝජන ආදායම අඩු කොට ඉතිරි වන ප්‍රමාණයයි. විලියම්ස් වාර්තාවෙහි පිටරටට යැවෙන ආයෝජන ආදායම අඩු නොකොට මෙරටට ලැබෙන දළ ආයෝජන ආදායම ගණන් ගන්නා ලදී. තව දුරටත් එයට සාවද්‍ය අන්දමින් විදේශීය සංචාර, පුද්ගලික ත්‍යාග හා සංක්‍රමණික පැවැරුම් වලින් වූ ලැබීම් ද ඇතුළත් කරන ලදී.

### සාධක නොවන සේවා අපනයනයන්හි පෞද්ගලික පාරිභෝජනය 11 – 3 සටහනෙහි 1 ඇ (ii) ශීර්ෂය

"විදේශීය සංචාර", "පරිවහණය හා රක්ෂණය", "විවිධ" යන ගෙවුම් ශෙෂ ශීර්ෂයන් යටතේ සාධක නොවන සේවාවන්හි සියලුම පුද්ගලික මිල දී ගැනීම් ඇතුළත් කොට එයට ඇතුළත් විෂයයන් පුළුල් කොට සම්පූර්ණ කිරීමට උත්සාහයක් දරා ඇත. මෙහි දී ආනයන කළ ආහාර හා අනෙකුත් පෞද්ගලික පාරිභෝජන භාණ්ඩවල සිල්ලර වටිනාකම්වලට ඇතුළත් කරනු ලැබූ සේවාවන් දෙවරක් ගණන් ගැනීම වැළැක්වීමට උත්සාහ කරන ලදී. මින් පෙර ඇස්තමේන්තුවල සාධක නොවන සේවා විෂය මාලාව අසම්පූර්ණව පැවැතියේය. එයට ඇතුළත් වූයේ විදේශීය සංචාර පමණකි.

### අනේවාසිකයන් විසින් මිලට ගත් සේවා – 11-3 සටහනෙහි 1 (ඇ) ශීර්ෂය

මින් පෙර ඇස්තමේන්තුවල දී, ලංකාවේ අනේවාසිකයන් විසින් දරන ලද සංචාරක වියදම් පමණක් ගණන් ගන්නා ලදී. වර්තමාන ඇස්තමේන්තුවල සංචාරක වියදම්වලට අතිරේක වශයෙන් පරිවහණය හා රක්ෂණය වෙනුවෙන් (ප්‍රති අපනයන හැර) අනේවාසිකයන් දරන වියදම් විදේශීය රාජ්‍යයන් විසින් දරන තානාපති කටයුතු වියදම් හා අනෙකුත් වියදම් හා විවිධ ශීර්ෂ ගණන් ගෙන ඇත.

### රජයේ පාරිභෝජනය - 11 - 3 සටහනේ 11 ශීර්ෂය

මින් පෙර රජයේ පාරිභෝජනය පිළිබඳ ඇස්තමේන්තු සකස් කිරීමේ දී, පැවැරුම් ශීර්ෂයන් හැරෙන්නට, රජය විසින් ආනයන කරන ලද, ප්‍රාග්ධන නොවන භාණ්ඩ රජයේ වර්තන වියදම්වලින් ඉවත් කරනු ලැබීය. රජයේ පාරිභෝජනය ගණන් ගැනීමේ දී රජයේ ආනයන භාණ්ඩ ඉවත් කිරීම න්‍යායානුකූලව වැරදිය.

---

* ආධාර පාඨශාලාවල හා විශ්ව විද්‍යාලවල ගුරුවරුන් රජයේ සේවකයන් ලෙස සලකා ඇත්තේ සංඛ්‍යා සකස් කිරීමේ පහසුව සඳහාය.

රජයේ පාරිභෝජන පිළිබඳ වර්තමාන ඇස්තමේන්තුවට, රජයේ ගොඩනැගිලි සඳහා ආරෝපිත කුලීද, ඇතුළත් වෙයි. එක්සත් ජාතීන්ට යැවීම සඳහා, ජාතික වියදම් ඇස්තමේන්තු කිරීමේ දී, සංඛ්‍යා හා ජනලේඛන දෙපාර්තමේන්තුව විසින් මෙම ක්‍රමය මෑත අවුරුදු වලදී අනුගමනය කරන ලදී.

**පෞද්ගලික අංශයෙහි දළ ස්ථිර ප්‍රාග්ධන සම්පාදනය 11 - 11 සටහනෙහි අ ( ) ශීර්ෂය**

මෙම ශීර්ෂයේ ඇස්තමේන්තුවලට, රජයේ සමායතනවල ප්‍රාග් ධන සම්පාද-නය ද දුම්රිය හා විදුලි වැනි රජයේ ව්‍යාපාරද ඇතුළත්ය.

වර්තමාන ඇස්තමේන්තුවල මෙම ශීර්ෂයට ඇතුළත් වන විෂයයන් පුළුල් කරන ලදි. පළමුව, අළුත් වගා කිරීමට අතිරේකව නැවත වගා කිරීම ඇතුළත් කොට ඇත. දෙවනුව, ප්‍රාග්ධන භාණ්ඩ අපනයනයට අදාළ අනියම් මාර්ගවලින් ලබාගත් තොරතුරු අනුව සකස් කළ අනෙකුත් බොහෝ වර්ගවල ප්‍රාග්ධන සම්පාදනයන්හි ඇස්තමේන්තු, ආනයන කළ සියලුම ප්‍රාග්ධන භාණ්ඩ ඉතා දැඩිව හා සවිස්තරව වර්ග කොට, ඒ අනුව සකස් කරන ලදි. උදාහරණයක් වශ-යෙන් නිවාස තැනීම සහ වෙනත් ගොඩනැගිලි තැනීම් ඇස්තමේන්තු කිරීමේදී, ගොඩනැලි භාණ්ඩවල සියලු ආනයන, රජයේ ප්‍රාග්ධන භාණ්ඩ ආනයන (රජය විසින් රජයේ සමායතනයන් සඳහා ආනයනය කළ භාණ්ඩ හැර) සහ ප්‍රාග්ධන භාණ්ඩ ප්‍රති-අපනයන, අඩු කිරීමෙන් ගලපන ලදී. ඉන්පසුව නිවාස හා අනෙකුත් ගොඩනැගිලිවල ප්‍රාග්ධන සම්පාදන ඇස්තමේන්තුව ලබා ගනුයේ, සිරිත් පරිදි, 10/3 ගුණකය, ගැලපූ පෞද්ගලික ප්‍රාග්ධන භාණ්ඩවලට යෙදීමෙනි. යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ පිළිබඳ ප්‍රාග්ධන සම්පාදන ඇස්තමේන්තු ලබා ගන්නා ලද්දේ, මෙරට සාදනු ලැබූ යන්ත්‍ර සූත්‍රවල ප්‍රාග්ධන සම්පාදනයට, ආනයන කළ විශාල යන්ත්‍රවල හා අනෙකුත් යන්ත්‍රවල (සවිකිරීමේ වියදම් ද ඇතුළත්) ප්‍රාග්ධන සම්-පාදනය ද එකතු කිරීමෙනි. ආනයන කළ පරිවහණ උපකරණ හා අනෙකුත් ආනයන කළ ප්‍රාග්ධන භාණ්ඩ අනුවද, ප්‍රාග්ධන සම්පාදනයන්හි ඇස්තමේන්තු සකස් කරන ලදි.

**පෞද්ගලික දේශීය ප්‍රාග්ධන සම්පාදනය – 11-3 සටහනෙහි (iii) ශීර්ෂය**

**රජයේ දේශීය ප්‍රාග්ධන සම්පාදනය 11 - 3 සටහනෙහි (vi) ශීර්ෂය**

ස්ථිර ප්‍රාග්ධන සම්පාදනයට අතිරේකව, මෙම ශීර්ෂ යටතේ තොග වෙනස් කම් ද, සැලකිල්ලට ගනු ලැබේ. මෙය අවශ්‍යවනුයේ නිෂ්පාදන හා වියදම් අනු-සාරයන් අතර අවිරොධත්වය තබා ගැනීමටය. මක්නිසාදයත්, තොග වෙනස සැලකිල්ලට නො ගන්නේ නම් පාරිභෝජනයට එකතු වූ ප්‍රාග්ධන සම්පාදනයෙහි වටිනාකම, නිෂ්පාදන වටිනාකමෙන් වෙනස් වන බැවිනි.

**පෞද්ගලික අංශයෙහි ප්‍රාග්ධන සංවර්ධනයෙහි ශුධ පිරිවැටුම (භාණ්ඩ හා සේවා) 11 - 2 සටහනෙහි 11 (iii) අංශීර්ෂය**

මෙම ශීර්ෂයට, නියම ගොඩනැගිලි කර්මාන්තයෙහි පමණක් නොව, මෙරට නිපදවන ගොඩනැගිලි ද්‍රව්‍ය පරිවහණයෙහි ද ශුද්ධ පිරිවැටුම ඇතුළත් වේ. එබැවින් වර්තමාන ඇස්තමේන්තුවල පිරිවැටුම ලබා ගනුයේ ප්‍රාග්ධන සම්පාදනයෙහි අනුරූප ඇස්තමේන්තුවලින්, පාවිච්චි කරන ලද ආනයන ප්‍රාග්ධන භාණ්ඩ වටිනාකම, ඒවායේ ආනයන තීරුබදු හා බෙදා හැරීමේ, වියදම් අඩු කර ගැනීමෙනි. මින් පෙර ඇස්තමේන්තුවල බෙදා හැරීමේ වියදම් අඩු කොට නැත. මේ නිසා මේ ශීර්ෂ යටතේ දෙවරක් එකම දේ ගණන් ගෙන ඇත. මක්නිසාදයත්, ආනයන ප්‍රාග්ධන භාණ්ඩ වල බෙදා හැරීමේ වියදම්, වෙළඳම හා පරිවහණය යටතේ ගණන් ගෙන තුබූ බැවිනි.

**මෙරට නිපදවනු ලැබූ භාණ්ඩ හා සේවා-වෙනත් තැනක ඇතුළත්නොකළ 11 - 10 සටහනෙහි ආ (iv) ශීර්ෂය**

මේ ශීර්ෂය යටතට ගැනෙන විෂය ප්‍රමාණය පුළුල් කොට ඇත.

## සංඛ්‍යා සටහන් පිළිබඳ අතිරේක සටහන්

### 11—4—පවත්නා මිල අනුව දළ ජාතික නිෂ්පාදිත වියදම

මෙම සටහනෙහි වම් පසෙහි, නිෂ්පාදන අනුසාරයෙන්, පවත්නා වෙළෙඳ මිල අනුව දළ ජාතික නිෂ්පාදිතයෙහි ඇස්තමේන්තුවක් දක්වා ඇත. මෙය ලබා ගෙන ඇත්තේ ආධාර හැර අවක්‍ර බදු (පළාත්පාලන වරිපනම් ඇතුළත්) සාධක මිල අනුව දළ ජාතික නිෂ්පාදිතයට එකතු කිරීමෙනි. දකුණු පසෙහි 4 සිට 11 දක්වා වූ ශීර්ෂයන් ගෙන්, වියදම් අනුසාරයෙන් වූ ඇස්තමේන්තු දැක්වෙයි. 11 ශීර්ෂය (වෙළෙඳ මිල අනුව දළ දේශීය නිෂ්පාදිත වියදම) හා 12 ශීර්ෂය (පිටරටින් ලද සාධක ආදායම – ශුද්ධ) එකතු වූ විට එය දළ ජාතික වියදමට (11 – 3 සටහනෙහි vii ශීර්ෂය) සමාන වෙයි.

යම් යම් කරුණු නිසා නොවන්නට 11 ශීර්ෂය හා 12 වැනි ශීර්ෂය එකතු වූ විට එය 14 වැනි ශීර්ෂයට (වෙළෙඳ මිල අනුව දළ ජාතික නිෂ්පාදිත වියදම) සමාන වන්නට ඉඩ තිබිණි. මේ කරුණු නම්, පළමුව, නිෂ්පාදිත හා වියදම් අනුසාරයන්ගේ ශීර්ෂයන්හි වටිනාකම් අන්‍යෝන්‍ය අවිරෝධතා ක්‍රමයක් පදනම් කොට සකස් කළ යුතුය. දෙවනුව, සියලු තොග වෙනස්කම් දැනගත යුතුව තිබිණි. තුන්වෙනුව, නිෂ්පාදන හා වියදම් අනුසාරයෙන් වූ එක් එක් ශීර්ෂය ඇස්තමේන්තු කිරීමේ දී උපයෝගී කර ගත් වෙන් වෙන් තොරතුරුවල, සංඛ්‍යා විෂමතා නොතිබිය යුතුය. වර්තමාන ඇස්තමේන්තු සකස් කිරීමේ දී මෙම වෙනස් අනුසාරයන්ගේ වටිනාකම් වල අන්‍යෝන්‍ය වශයෙන් අවිරෝධතා ඇති නොවන සේ වග බලාගැනීමට සෑම ප්‍රයත්නයක්ම දරා ඇත. එසේ වුවද, දැන නොගත් තොග වෙනස්කම් නිසා හා දැනට ලැබී ඇති සංඛ්‍යා ඌනතා නිසා, 11 වැනි ශීර්ෂයෙහිත් 13 වැනි ශීර්ෂයෙහිත් ඓක්‍යය 13 වැනි ශීර්ෂයෙහි දැක්වූ ප්‍රමාණයෙන් 14 වැනි ශීර්ෂයට වඩා වෙනස් වෙයි. එබැවින් 13 වැනි ශීර්ෂයෙන් දැන නොගත් තොග වෙනස්කම් හා සංඛ්‍යා විෂමතා වන්හි විජක ඓක්‍යය පිළිබිඹු වෙයි.

**සටහන 11 – 5 ස්ථාවර සාධක මිල අනුව දළ ජාතික නිෂ්පාදිතය**

**සටහන 11 – 7 ස්ථාවර වෙළඳ මිල අනුව පාරිභෝජනයෙහි හා දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනයෙහි වියදම.**

ස්ථාවර මිල අනුව නිෂ්පාදනය හා වියදම ඇස්තමේන්තු කොට ඇත්තේ හැකිතාක් දුරට සවිස්තරව, එහි සමන්විත කොටස්, වෙන් වෙන්ව අවධමන කොට සලකා බැලීමෙනි. අවධමනකයන් වශයෙන් යොදා ගත හැකි මිල මට්ටම් නොලැබුන විට, විශේෂ දර්ශකයන් සකස් කර ගන්නා ලදි. මෙරට නිපදවන භාණ්ඩයන්ගේ පෞද්ගලික පාරිභෝජනය යටතේ ඇතුළත් වන පශු සම්පත වැනි ශීර්ෂයක ස්ථාවර මිල ඇස්තමේන්තු ලබා ගන්නා ලද්දේ, හරක් මස්, එළු මස්, අනෙකුත් මස්, කිරි හා බිත්තර වෙන් වෙන්ව අවධමන කිරීමෙනි. පෞද්ගලික අංශයෙහි දළ ස්ථිර ප්‍රාග්ධන සම්පාදනයෙහි ස්ථාවර මිල ඇස්තමේන්තු සඳහා, පහත දැක්වෙන කරුණු වෙනුවෙන් වෙන් වෙන්ව ස්ථාවර මිල ඇස්තමේන්තු සකස් කරන ලදි; වගා කිරීම, හා නැවත වගා කිරීම, ගෘහ හා අනෙකුත් ගොඩනැගිලි, යන්ත්‍ර හා යන්ත්‍රොපකරණ, පරිවහණය හා වෙනත් තැනක ඇතුළත් නො කළ ආනයන ප්‍රාග්ධන භාණ්ඩ.

මෙහිලා විශේෂයෙන් සඳහන් කළ යුතු කරුණක් නම්, රජයේ ශුද්ධ පිරිවැටුම්හි මිල ඇස්තමේන්තු, පවත්නා මිල ඇස්තමේන්තුවලට සමාන බවය. එබැවින් රජයේ සේවකයන්ට ගෙවන පෞද්ගලික දීමනාවන්හි වෙනස්කම්, ඔවුන්ගේ මූර්ත නිෂ්පාදනයන්හි වෙනස්කම් සම්පූර්ණයෙන්ම පිළිබිඹු කරන්නේ යයි සලකනු ලැබේ. මෙය නියම වශයෙන් නිවැරදි නොවූවද, වෙනත් ක්‍රමයක් උපයෝගී කර ගැනීම අසීරුය. මක්නිසාද යත්, මිල වෙනස්කම් පමණක් දක්වන මානකයක් වශයෙන් අවධමනකයක් ලබා ගැනීම ඉතා දුෂ්කර බැවිනි. (රජයේ සේවකයින්ගේ වැටුප් ප්‍රමාණයන්හි මිල දර්ශකයකින්, මිල වෙනස්කම් පමණක් නොව මූර්ත නිෂ්පාදනය ද පිළිබිඹු වන්නට පුළුවන.)

**11 – 6 වැනි සටහන ලංකාවේ මූර්ත නිෂ්පාදිතය කෙරෙහි විදේශීය වෙළෙඳ අනුපාතයෙහි බලපෑම.**

මින් පෙරවාර්ෂික වාර්තාවල පළ කැරුණු මෙම සටහන න්‍යායානුකූලව සදෝස් බැවින් එය සම්පූර්ණයෙන්ම ප්‍රතිශෝධනය කොට තිබේ. කලින් පළ කළ සටහන්වල ස්ථාවර සාධක මිල අනුව වූ දළ ජාතික නිෂ්පාදිතය, විදේශීය වෙළෙඳ අනුපාතයේ බලපෑමද ඇතුළත් මූර්ත දළ ජාතික නිෂ්පාදිතයට සමාන බැව්, සලකා ඇත. මෙය වැරදිය. ස්ථාවර මිල අනුව වූ දළ නිෂ්පාදිතයෙන් පිළිබිඹුවන්නේ, විදේශීය වෙළෙඳ අනුපාතයෙහි බලපෑම රහිතව වූ මූර්ත දළ ජාතික නිෂ්පාදිතයයි. වර්තමාන ඇස්තමේන්තුවල, ස්ථාවර මිල අනුව වූ දළ ජාතික නිෂ්පාදිත සංඛ්‍යාවන් නිරවද්‍ය ලෙස, මූර්ත ජාතික නිෂ්පාදිත (ක්ෂයවීමෙහි දළ ප්‍රමාණය) යනුවෙන් නම් කොට තිබේ. වෙළෙඳ අනුපාතයෙහි බලපෑම ද සහිතව ගැලපූ සංඛ්‍යාවන්ට මූර්ත ජාතික ආදායම යයි කියනු ලැබේ. එබැවින් 1961 දී, වෙළෙඳ අනුපාතය පිරිහීම නිසා මූර්ත ජාතික ආදායම, මූර්ත ජාතික නිෂ්පාදිතයට වඩා ප්‍රමාණවත්ව පහත වැටී ඇත. (උදා. : ස්ථාවර මිල අනුව දළ ජාතික නිෂ්පාදිතය)

**11 – 12 සටහන ස්ථාවර සාධක මිල අනුව දළ ජාතික නිෂ්පාදිතයෙහි කාර්මික සැකසුම**

මින් පෙර වාර්ෂික වාර්තාවන්හි පළ කළ ඇස්තමේන්තු හා වර්තමාන ඇස්තමේන්තු සකස් කිරීමේ ක්‍රමයන්හි ප්‍රධාන වෙනස්කම් පහත දැක්වේ.

පළමුව කෘෂිකර්මය, දුව ඇ වන ද්‍රව්‍ය, පශු සම්පත, ධීවර කර්මාන්තය යන ගණයට, සියලු කෘෂිකාර්මික අපනයන නිමැවීම් ඇතුළත්ය. (කලින් ඇස්තමේන්තුවල ඇතුළත් වූයේ තේ හා රබර් අපනයන නිමැවීම පමණෙකි.) දෙවෙනුව, රජයේ තැපැල් හා විදුලි පණිවුඩ සේවා කලින් ඇතුළත් කොට තිබුනේ සමාජ සේවා යටතේ වුවද, මේවර එය ගමනාගමනය, ගබඩා කිරීම හා පණිවුඩ හුවමාරුව යටතේ ඇතුළත් කොට ඇත. තුන් වැනුව, රාජ්‍ය පරිපාලනය හා ආරක්ෂාව යටතේ රජයේ ගොඩනැගිලි සඳහා ආරෝපිත කුලී ඇතුළත් වෙයි.. දළ දේශීය නිෂ්පාදිතයට ඇතුළත් වන සියලුම විස්තර ශීර්ෂ ඇස්තමේන්තු කිරීම් ක්‍රමයන්හි දැනටමත් විස්තර කර ඇති වෙනස් කිරීම්, සියලුම ශීර්ෂයන්ට ඇතුළත් කරුණුවල විෂය කෙරෙහි බලපා තිබෙන බව මෙහිලා වැඩිදුරටත් සඳහන් කළ යුතුය.